# මුදල් හා බැංකු කටයුතු

## මුදල් සැපයුම

### සමස්ත උපනතීන්

1990 වසරේ මූල්‍ය වර්ධනයන්හි දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණය වූයේ, බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් සහ දේශීය ණය සැළකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් පුළුල් මුදල් සැපයුමෙහි වර්ධන අනුපාතිකය වේගවත් වීමයි. මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වූ පටු මුදල් සැපයුම ($M_1$), 1989 වාර්ෂික වර්ධන අනුපාතිකය වූ සියයට 9 හා සසඳන කල 1990 දී සියයට 13 ක වර්ධන වේගයක් වාර්තා කළේය. කෙසේ වුවද, පටු මුදල් සැපයුමේ වර්ධනය වසර තුළදී විශාල උච්චාවචනයන්ට ලක්විණි. එහි වාර්ෂික වර්ධන වේගය 1989 අවසානයේ දී සියයට 9 සිට 1990 අප්‍රේල් අවසානයට සියයට 17 දක්වා ඉහල නැගුණද, 1990 දෙසැම්බර් මස අගදී සියයට 13 දක්වා ඉහල යාමට ප්‍රථම ඔක්තෝබර් මස අගදී සියයට 7 ක් දක්වා පහත වැටුණි. මේ අතර, $M_1$ සහ වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතුරුම් තැන්පතු (ආසන්න මුදල්) වලින් සමන්විත පුළුල් මුදල් සැපයුම ($M_2$) සියයට 12 ක වාර්ෂික වර්ධන අනුපාතිකයක සිට සියයට 19 ක වාර්ෂික වර්ධන අනුපාතිකයක් දක්වා මෙම වර්ෂයන් දෙක තුළ ඉහල නැගුණි. කෙසේ වුවද, $M_1$ හා සසඳන කල, $M_2$ හි වාර්ෂික වර්ධන වේගය 1990 පෙබරවාරි සහ නොවැම්බර් මාසයන් අතරතුර සියයට 15–17 පරාසයක පැවති අතර, 1990 දෙසැම්බර් මාසය අවසානයේදී සියයට 2 කින් ප්‍රසාරණය වී සියයට 19 ක් දක්වා ඉහල නැගුණි.


1990 අගදී රුපියල් දශ ලක්ෂ 31,579 ක් වූ මූල්‍ය පදනම (සංචිත හෝ අධිබලැති මුදල්) වසර තුළ රුපියල් දශ ලක්ෂ 4,789 කින් හෙවත් සියයට 17.9 කින් ඉහළ නැගීමක් වාර්තා කළේය. මෙම ඉහළයාම ඉකුත් වසරේ වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 1,227 හෝ සියයට 4.8 හා සැසඳේ. මූලාශ්‍ර අංශයෙහි ලා සළකන කල මෙම වැඩිවීම සම්පූර්ණ වශයෙන්ම වාගේ මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වල අධික වර්ධනය වූ රුපියල් දශ ලක්ෂ 2,997 හේතුකොටගෙන විය. මේ හා සසඳන කල මහ බැංකුව සතු ශුද්ධ දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 1,792 කින් ඉහළ ගියේය. උපයෝජන අංශයෙහිලා සළකන කල මූල්‍ය පදනමෙහි වැඩිවීම, මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුවේ වැඩිවීම (රුපියල් දශ ලක්ෂ 2,775) සහ මහ බැංකුව වෙත වූ, වාණිජ බැංකු සතු තැන්පතු වර්ධනය (රුපියල් දශ ලක්ෂ 2,014) මගින් පිළිබිඹු විය.

### මුදල් සැපයුම හා එයට බලපෑ සාධක

වාර්ෂික පදනමක් මත, 1989 දී රුපියල් දශ ලක්ෂ 2,959 කින් හෙවත් සියයට 9 කින් වර්ධනය වූ පටු මුදල් සැපයුම ($M_1$) 1990 දී රුපියල් දශ ලක්ෂ 4,540 කින් හෙවත් සියයට 13 කින් ප්‍රසාරණය විය. මෙය මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවල වූ පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,470 ක හෙවත් සියයට 13 ක සහ රුපියල් දශ ලක්ෂ 2,070 ක හෙවත් සියයට 13 ක වර්ධනයන්ගෙන් සමන්විත විය. මේ අතර, 1989 රුපියල් දශ ලක්ෂ 5,528 ක හෙවත් සියයට 16 ක වැඩිවීම සහ සසඳන කල 1990 දී ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 10,044 කින් හෙවත් සියයට 24 කින් ඉහළ යමින් තීව්‍ර වූ වර්ධන අනුපාතයක් පෙන්වීය. මේ අනුව, පුළුල් මුදල් සැපයුම ($M_2$) පෙර වසරේ වූ සියයට 12 ක වර්ධන අනුපාතිකය හා සසඳන කල 1990 දී සියයට 19 කින් ඉහළ ගියේය.

# මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.55 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් 1988 – 1990

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයට | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | වෙනස % 1987/1988 | වෙනස % 1988/1989 | වෙනස % 1989/1990 | 1988 | 1989 | 1990 | වෙනස % 1987/1988 | වෙනස % 1988/1989 | වෙනස % 1989/1990 |
| ජනවාරි .. | 25,336 | 31,237 | 35,442 | + 16·0 | + 23·3 | + 13·5 | 60,060 | 67,980 | 76,879 | + 15·8 | + 13·2 | + 13·1 |
| පෙබරවාරි .. | 25,672 | 31,754 | 36,750 | + 18·1 | + 23·7 | + 15·7 | 60,846 | 68,143 | 78,590 | + 15·2 | + 12·0 | + 15·3 |
| මාර්තු .. | 26,640 | 32,615 | 37,402 | + 18·1 | + 22·4 | + 14·7 | 61,081 | 69,841 | 81,169 | + 13·4 | + 14·3 | + 16·2 |
| අප්‍රේල් .. | 27,467 | 32,718 | 38,122 | + 24·2 | + 19·1 | + 16·5 | 62,465 | 70,503 | 81,876 | + 17·2 | + 12·9 | + 16·1 |
| මැයි . | 28,178 | 31,862 | 36,767 | + 26·3 | + 13·1 | + 15·4 | 63,687 | 69,750 | 80,771 | + 18·0 | + 9·5 | + 15·8 |
| ජූනි .. | 27,792 | 32,037 | 36,386 | + 25·9 | + 15·3 | + 13·6 | 63,118 | 69,717 | 81,407 | + 17·0 | + 10·5 | + 16·8 |
| ජූලි .. | 28,053 | 33,447 | 36,206 | + 24·3 | + 19·2 | + 8·2 | 63,645 | 70,867 | 81,469 | + 16·5 | + 11·3 | + 15·0 |
| අගෝස්තු . | 28,234 | 34,016 | 36,496 | + 21·9 | + 20·5 | + 7·3 | 64,116 | 71,345 | 82,956 | + 16·1 | + 11·3 | + 16·3 |
| සැප්තැම්බර් . | 28,453 | 34,527 | 37,429 | + 23·8 | + 21·3 | + 8·4 | 63,932 | 72,964 | 85,057 | + 14·3 | + 14·1 | + 16·6 |
| ඔක්තෝබර් .. | 28,684 | 34,533 | 36,811 | + 23·9 | + 20·4 | + 6·6 | 64,371 | 73,375 | 85,973 | + 13·8 | + 14·0 | + 17·2 |
| නොවැම්බර් .. | 30,379 | 34,103 | 37,490 | + 29·0 | + 12·3 | + 9·9 | 66,088 | 73,942 | 86,659 | + 16·1 | + 11·9 | + 17·2 |
| දෙසැම්බර් .. | 32,379 | 35,338 | 39,878 | + 29·1 | + 9·1 | + 12·8 | 67·946 | 76,434 | 91,017 | + 16·4 | + 12·5 | + 19·1 |
| මාසික සාමාන්‍ය .. | 28,106 | 33,182 | 37,098 | + 23·4 | + 18·1 | + 11·8 | 63,446 | 71,238 | 82,819 | + 15·8 | + 12·3 | + 16·2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1.56 වැනි සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක 1988 – 1990

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1988 දෙසැම්බර් | 1989 දෙසැම්බර් | 1990 දෙසැම්බර් | 1988/1989 වෙනස ප්‍රමාණය | 1988/1989 වෙනස ප්‍රතිශතය | 1989/1990 වෙනස ප්‍රමාණය | 1989/1990 වෙනස ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| **1.** මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. | 18,487 | 19,650 | 22,120 | + 1,163 | + 6·3 | + 2,470 | + 12·6 |
| **2.** මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු .. | 13,892 | 15,688 | 17,758 | + 1,796 | + 12·9 | + 2,070 | + 13,2 |
| පටු මුදල් සැපයුම ($M_1$) .. | **32,379** | **35,338** | **39,878** | **+ 2,959** | **+ 9·1** | **+ 4,540** | **+ 12·8** |
| **3.** වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු .. | 35,567 | 41,095 | 51,139 | + 5,528 | + 15·5 | + 10,044 | + 24·4 |
| 3.1 සමූපකාර ආයතන .. | 743 | 895 | 927 | + 152 | + 20·5 | + 32 | + 3·6 |
| 3.2 රාජ්‍ය සංස්ථා .. | 5,103 | 4,230 | 4,664 | – 873 | – 17·1 | + 434 | + 10·3 |
| 3.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් (අ) .. | 29,721 | 35,970 | 45,548 | + 6,249 | + 21·0 | + 9,578 | + 26·6 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. | **67,946** | **76,433** | **91,017** | **+ 8,487** | **+ 12·5** | **+ 14,584** | **+ 19·1** |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| **1.** දේශීය ණය .. | 96,867 | 102,321 | 119,864 | + 5,454 | + 5·6 | + 17,543 | + 17·1 |
| 1.1 රජයට දෙන ලද ශුද්ධ ණය .. | 36,065 | 36,119 | 39,197 | + 54 | + 0·1 | + 3,078 | + 8·5 |
| 1.1.1 රජයට දෙන ලද දළ ණය .. | 44,311 | 44,740 | 52,524 | + 429 | + 1·0 | + 7,784 | + 17·4 |
| මහ බැංකුව විසින් .. | 36,439 | 36,741 | 38,206 | + 302 | + 0·8 | + 1,465 | + 4·0 |
| වාණිජ බැංකු විසින් .. | 7,872 | 7,999 | 14,318 | + 127 | + 1·6 | + 6,319 | + 79·0 |
| 1.1.2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ .. | – 8,246 | – 8,621 | – 13,327 | – 375 | – 4·5 | – 4,706 | – 54·6 |
| 1.2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 60,802 | 66,202 | 80,667 | – 5,400 | + 8·9 | + 14,465 | + 21·8 |
| 1.2.1 සමූපකාර ආයතන .. | 1,318 | 1,178 | 1,596 | – 140 | – 10·6 | + 418 | + 35·5 |
| 1.2.2 රාජ්‍ය සංස්ථා .. | 10,787 | 13,862 | 15,636 | + 3,075 | + 28·5 | + 1,774 | + 12·8 |
| 1.2.3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් .. | 48,697 | 51,162 | 63,435 | + 2,465 | + 5·1 | + 12,273 | + 24·0 |
| **2.** බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. | 7.058 | 4,732 | 10.206 | – 2,326 | – 32·9 | + 5,474 | + 115·7 |
| 2.1 මහ බැංකුවෙන් .. | 4,326 | 1,678 | 4,675 | – 2,647 | – 61·2 | + 2,997 | + 178·6 |
| 2.2 වාණිජ බැංකුවලින් .. | 2,732 | 3,054 | 5,531 | + 322 | + 11·8 | + 2,477 | + 81·1 |
| **3.** අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. | – 35,979 | – 30,620 | – 39,053 | + 5,359 | + 14·9 | – 8,433 | – 27·5 |
| 3.1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | – 15,541 | – 13,176 | – 15,039 | + 2,365 | — | – 1,863 | — |
| 3.2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) .. | – 20,038 | – 19,043 | – 24,968 | + 995 | — | – 5,925 | — |
| 3.3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි .. | – 400 | 1,599 | 954 | + 1,999 | — | – 645 | — |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. | **67.946** | **76,433** | **91,017** | **+ 8,487** | + 12·5 | **+ 14,584** | + 19·1 |


සටහන: සළකුණුවලින් පුළුල් මුදල් සැපයුම ($M_2$) හි බලපෑම දක්වේ.

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

# දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1990 දී ආසන්න මුදල්වල ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් බලපානු ලැබුයේ අනෙකුත් පෞද්ගලික අංශය සතු කාලීන හා ඉතුරුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 9,578 කින් හෙවත් සියයට 27 කින් වැඩිවීමයි. ඉකුත් වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 873 ක හෙවත් සියයට 17 ක අඩුවීමට ප්‍රතිවිරුද්ධව රාජ්‍ය සංස්ථාවල කාලීන හා ඉතුරුම් තැන්පතු 1990 දී රුපියල් දශ ලක්ෂ 434 කින් හෙවත් සියයට 10 කින් වර්ධනය වූ අතර, සමුපකාර ආයතන සතු කාලීන හා ඉතුරුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 32 කින් හෙවත් සියයට 4 කින් ඉහළ ගියේය. ආසන්න මුදල්වල වසර තුල දක්නට ලැබූ සැළකිය යුතු වර්ධනය එක් අයුරකින් වාණිජ බැංකු මගින් තැන්පතු සඳහා පිරිනැමූ තරඟකාරී පොළී අනුපාතික ද තවත් අයුරකින් ශුද්ධ විදේශ වත්කම් වැඩිවීම හේතුවෙන් සැළකියයුතු පරිදි ද්‍රවශීලතාවය ප්‍රසාරණය වීමද පිළිබිඹු කළේය.

වසර තුළදී, දේශීය ණය මෙන්ම බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් ද මූල්‍ය සමස්තයන් මත ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කළේය. කෙසේ වුවද, ප්‍රමාණය අතින් සළකන කල දේශීය ණය වර්ධනය වැඩි බලපෑමක් ඇති කරන ලදී. 1989 දී දක්නට ලැබූ ආන්තික වර්ධනය වූ රුපියල් දශ ලක්ෂ 5,454 හෙවත් සියයට 6 හා සසඳන කල 1990 දී දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 17,543 ක් හෙවත් සියයට 17 ක් විය.

පෞද්ගලික අංශයේ, විශේෂයෙන්ම අනෙකුත් පෞද්ගලික අංශයේ ඉහල ප්‍රමාණයක ණය උපයෝජනය, වසර පුරා පැවති දේශීය ණය වර්ධනය බොහෝ දුරට පැහැදිලි කරයි. කෙසේ වුවද, 1990 වසර තුළ විශේෂයෙන්ම 1990 අගෝස්තු මස සිට බැංකු ක්‍රමය වෙතින් රජයට දෙන ලද ශුද්ධ ණය වර්ධනය සමස්ත දේශීය ණය වර්ධනය තීව්‍ර කරනු ලැබීය.

රුපියල් දශ ලක්ෂ 4,706 ක තැන්පතු ප්‍රමාණයක් පැවතියද රජයට දෙනු ලැබූ ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 3,078 කින් හෙවත් සියයට 9 කින් 1990 දී වර්ධනය විය. වසරේ අවසාන මාසයන් තුල රජය මගින් බැංකු ණය සීඝ්‍ර ලෙස උපයෝජනය කිරීම මීට හේතුවිය. වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් දැරීම රුපියල් දශ ලක්ෂ 5,124 කින් වැඩිවීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇති වගකීම් හි (සළාකය ද ඇතුළුව) ප්‍රති ඇගයීම හේතුවෙන් පැන නැගුණු රජයට දුන් විශේෂ ණයක් වූ රුපියල් දශ ලක්ෂ 3,055 ඇතුළුව මහ බැංකුව මගින් රජයට දෙනු ලැබූ තාවකාලික අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 3,563 කින් වැඩිවීම රජයට දෙනු ලැබූ දළ ණය වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපෑවේය. කෙසේ වුවද, අවසාන වශයෙන් සඳහන් කළ අයිතමය ඍජුව අයවැය කටයුතු හේතුවෙන් සිදු නොවූ අතර, අයවැය කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස රජයට දෙනු ලැබූ ශුද්ධ ණය වැඩිවීම ඉතා සුළු ප්‍රමාණයක පැවතුණි.

පෞද්ගලික අංශයේ ණය මත පනවනු ලැබූ ආංශික ණය සීමාව පැවතියද 1990 දී පෞද්ගලික අංශයට දෙනු ලැබූ දළ ණය රුපියල් දශ ලක්ෂ 14,465 කින් හෙවත් සියයට 22 කින් වර්ධනය විය. 1989 දී එම ණය රුපියල් දශ ලක්ෂ 5,400 කින් හෙවත් සියයට 9 කින් වැඩිවිණි. වෙළඳ වාතාවරණයේ දියුණුව හා යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ආර්ථික කටයුතුවල සීඝ්‍ර දියුණුව හා විදුලිබල හා ඛනිජතෙල් මිළ ගණන් ඉහළ නැංවෙන ලෙස සිදුවූ මිල ප්‍රතිශෝධනයන් නිසා වැඩිවුණු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ද පෞද්ගලික අංශයේ ඉහල ණය ඉල්ලුමට ප්‍රධාන වශයෙන් හේතුවිය.

වෙන් වශයෙන් සළකන කල, පෞද්ගලික අංශයේ උප කණ්ඩායම් තුනෙහිම ණය උපයෝජනය විමසුමට පාත්‍රවන වසර තුළදී ඉහළ ගියේය. වාණිජ බැංකු වෙතින් අනෙකුත් පෞද්ගලික අංශයට දෙනු ලැබූ ණය රුපියල් දශ ලක්ෂ 12,273 කින් හෙවත් සියයට 24 කින් 1990 දී වර්ධනය විය. මේ හා සැසඳුන 1989 වර්ධනය වූයේ රුපියල් දශ ලක්ෂ 2,465 ක් හෙවත් සියයට 5 කි. මේ අතර රාජ්‍ය සංස්ථාවලට දෙනු ලැබූ ණය රුපියල් දශ ලක්ෂ 1,774 කින් හෙවත් සියයට 13 කින් වර්ධනය විය. මෙය පසුගිය වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 3,075 ක හෙවත් සියයට 29 ක වර්ධනයට වඩා අඩු ප්‍රමාණයකි. රාජ්‍ය සංස්ථා අංශයේ ප්‍රධාන

ණය ගැනුම් කරුවන් වූයේ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ෂ), ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) හා රාජ්‍ය වැවිලි සංස්ථාව වූ අතර ඔවුන් විසින් නොපියවා පැවති ණය ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,224 කින් රුපියල් දශ ලක්ෂ 610 කින් හා රුපියල් දශ ලක්ෂ 237 කින් ඉහල නැගුණි. සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ණය උපයෝජනය ඉහල යාමට ප්‍රධාන හේතුව වූයේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය හා අතිරේක තොග පවත්වා ගෙන යාම සඳහා මූල්‍ය අවශ්‍යතාවයන් පැන නැගීමයි. මෙයට ඉහත මෙම කටයුතු සිදුකළේ ආහාර පාලක විසිනි. 1989 දී සමුපකාර අංශය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 140 කින් හෙවත් සියයට 11 කින් පහත වැටුණු බැංකු ණය කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා වැඩිවුණු ණය ඉල්ලුම මෙන්ම, කෘෂිකාර්මික යෙදවුම් සඳහා ඉහළ ගිය ණය අවශ්‍යතාවය, විශේෂයෙන්ම 1990 දී පොහොර සහනාධාරය ඉවත් කිරීම නිසා පොහොර මිලට ගැනීම සඳහා ණය ඉල්ලුම වැඩිවීම හේතුවෙන් 1990 දී රුපියල් දශ ලක්ෂ 419 කින් හෙවත් සියයට 36 කින් වැඩිවිය.

මේ අතර, 1990 දී බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. මෙය 1989 දී අත්දැකීමට ලැබුණු අඩුවීමට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. සමස්තයක් වශයෙන් 1989 දී දක්නට ලැබුණු රුපියල් දශ ලක්ෂ 2,326 ක හෙවත් සියයට 33 ක අඩුවීමට එරෙහිව 1990 දී බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශ වත්කම් රුපියල් දශ ලක්ෂ 5,474 කින් හෙවත් සියයට 116 කින් වර්ධනය විය. ශුද්ධ විදේශ වත්කම්වල ප්‍රසාරණය මහ බැංකුව සතු වත්කම් රුපියල් දශ ලක්ෂ 2,996 කින් හෙවත් සියයට 179 කින් සහ වාණිජ බැංකු සතු එවැනි වත්කම් රුපියල් දශ ලක්ෂ 2,478 කින් හෙවත් සියයට 81 කින් වැඩිවීමෙන් සමන්විත විය. විදේශීය මුදල් සහ ශේෂ වැඩිවීම හා සමග විදේශීය රාජ්‍යයන්ගේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 4,016 කින් හා රුපියල් දශ ලක්ෂ 2,856 කින් වැඩිවීම සහ විදේශ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 2,631 කින් විශාල වශයෙන් පහත වැටීම මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රසාරණයට බලපෑ ප්‍රධාන හේතු සාධකයන් විය. කෙසේ වුවද, මෙම වැඩිවීම මගින් මහ බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් වෙත වූ බලපෑම ජාත්‍යන්තර සංවිධානවල තැන්පතු රුපියල් දශ ලක්ෂ 6,069 කින් වැඩිවීම මගින් විශාල ලෙස සමනය කරන ලදී. මේ අතර, වසර තුලදී, වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් වර්ධනය, විදේශ බැංකු වෙතැති මුදල් හා විදේශ ව්‍යවහාර බැංකු ඒකක වෙතැති මුදල් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,146 කින් හා රුපියල් දශ ලක්ෂ 3,418 කින් වැඩිවීම තුලින් පිළිබිඹු විය. කෙසේ වුවද, මෙම වැඩිවීමෙන් කොටසක් විදේශ විනිමය වගකීම් රුපියල් දශ ලක්ෂ 2,736 කින් වැඩිවීම මගින් අඩුකරනු ලැබීය. යහපත් ගෙවුම් තුලන තත්ත්වය සමග ණය ලබාගත හැකි මාර්ගයන්ගේ ඉහළයාම වසර තුළදී බැංකු ක්‍රමය සතු විදේශ වත්කම් ඒකරාශිවීමට හේතුවිය.


**වාණිජ බැංකු කටයුතු**

**සමස්ත උපනතීන්**

විමසුමට ලක් කෙරෙන වසර තුළ දී වාණිජ බැංකුවල සමස්ත ද්‍රවශීල තත්ත්වය වර්ධනය විය. ඉල්ලුම් තැන්පතුවලට ද්‍රවශීල වත්කම් අනුපාතය, 1989 වර්ෂය අවසානයේදී සියයට 130.7 ක සිට 1990 වර්ෂය අවසානයේදී සියයට 149.1 දක්වා ඉහළ ගියේය. මෙය, ද්‍රවශීල වත්කම් රුපියල් දශ ලක්ෂ 12,079 කින් සීඝ්‍ර ලෙස වර්ධනය වීම හා සළකන කල ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 5,441 ක වැඩිවීමෙහි ප්‍රතිඵලයකි. ද්‍රවශීල වත්කම්වල ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 5,124 කින් හෙවත් සියයට 84 කින් හා විදේශවල පිහිටි බැංකු වලින් අයවිය යුතු හා අතැති විදේශීය ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 4,470 කින් හෙවත් සියයට 58 කින් වැඩිවීම මගින් පිළිබිඹු විය. මෙයට අමතරව මහ බැංකුවෙන් අයවිය යුතු මුදල්, අතැති මුදල් සහ වට්ටම් කළ බිල්පත් ද පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,497, රුපියල් දශ ලක්ෂ 299 සහ රුපියල් දශ ලක්ෂ 665 බැගින් ඉහළ ගියේය.

# බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1990 වසරේදී බැංකු ක්‍රමය තුල වූ සමස්ත ද්‍රවශීල තත්ත්වය වර්ධනය වුවද, ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි මුළු ණයට ගැනීම් සහ ණයදීම් ඉහලයාමේ ප්‍රවනතාවයක් පෙන්වීය. මෙම ප්‍රවනතාවය විශේෂයෙන් වසරේ මුල් කාර්තු තුනෙහිදී දක්නට ලැබුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ මූල්‍ය භිභයනට මුහුණ පෑ බැංකු විසින් කෙටිකාලීන අරමුදල් සඳහා වූ ඉහළ ගිය ඉල්ලුම මෙන්ම ඇතැම් බැංකු විසින් ඉඳ හිට ද්‍රවශීල අරමුදල් විශාල ප්‍රමාණයන්ගෙන් ඉල්ලුම් කිරීමය. කෙසේ වුවද, 1990 වසරේ අවසාන කාර්තුවෙහිදී ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි ණය ගැනීම් සහ ණයදීම් හි පහත වැටීමක් පෙන්නුම් කෙරිණි. මෙම තත්ත්වය පිළිබිඹු කරමින් ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි පොලී අනුපාතිකයන්ද අගෝස්තු මාසයේදී සියයට 19–30 උපරිම පරාසයක සිට වසර අවසාන වනවිට සියයට 14–19 පරාසයක් දක්වා අඩුවිය.

මේ අතර ආර්ථික කටයුතුවල වර්ධනය නොකඩවා ඉහළ මට්ටමක පැවති උද්ධමන අනුපාතිකය සහ විදුලිබල ගාස්තු සහ ඉන්ධන මිල ඉහළ නැංවෙන පරිදි සිදුවූ සංශෝධනයන් හේතුවෙන් විශේෂයෙන් වසරේ අවසන් කාර්තුව තුලදී වාණිජ බැංකුවල නොපියවා පැවති ණය ප්‍රමාණය තියුණු ලෙස ඉහළ ගියේය. සමස්තයක් ලෙස 1990 වසරේදී පෞද්ගලික අංශයට වාණිජ බැංකු විසින් දෙනු ලැබූ ණය රුපියල් දශ ලක්ෂ 14,465 කින් හෙවත් සියයට 22 කින් වර්ධනය වූ අතර වසරේ අවසාන කාර්තුව තුලදී ණයදීම් රුපියල් දශ ලක්ෂ 5,961 ක් හෙවත් වසර තුළ ඉහළ ගිය ණය ප්‍රමාණයෙන් සියයට 41 ක් විය.

**බැංකු වත්කම් හා වගකීම් ව්‍යුහය සහ පෞද්ගලික අංශයට දෙන ලද අත්තිකාරම්**

1990 වර්ෂය තුලදී වාණිජ බැංකු සතු මුළු වත්කම් හා වගකීම් (ශීර්ෂයට ප්‍රතිවිරුද්ධ අයිතමයන් හැර) රුපියල් දශ ලක්ෂ 26,012 කින් හෙවත් සියයට 24 කින් වර්ධනය විය. මේ හා සැසඳෙන පසුගිය වසරෙහි වර්ධනය රුපියල් දශ ලක්ෂ 10,537 ක් හෙවත් සියයට 11 කි. වගකීම් අංශයෙහි වූ මුළු තැන්පතු රුපියල් දශ ලක්ෂ 18,599 කින් හෙවත් සියයට 26 කින් ඉහළයාම, කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 13,152 කින් හෙවත් සියයට 27 කින් සහ ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 5,446 කින් හෙවත් සියයට 26 කින් වර්ධනයවීම් වලින් සමන්විත විය. වර්ෂය තුළදී විදේශීය බැංකුවලින් ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 24 කින් හෙවත් සියයට 2 කින් පහළ ගිය අතර, දේශීය අන්තර් බැංකු ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 3,253 කින් හෙවත් සියයට 60 කින් ඉහළ ගියේය. 1990 වසර තුලදී වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 2,889 කින් හෙවත් සියයට 12 කින් ඉහළ ගිය අතර, රැස්කිරීම පිණිස යවන ලද චෙක්පත් හේතුවෙන් අවිනිශ්චිත ගිණුමෙහි වූ ප්‍රසාරණය එයට විශාල වශයෙන් හේතු විය.

වත්කම් අංශයෙහි ලා ණය අයිරාවන් සහ මිලදී ගත් හා වට්ටම් කළ බිල්පත් රුපියල් දශ ලක්ෂ 14,811 කින් හෙවත් සියයට 22 කින් ඉහළ ගියේය. ණයට දීම් රුපියල් දශ ලක්ෂ 11,500 කින් හෙවත් සියයට 29 කින්ද, අයිරාවන් රුපියල් දශ ලක්ෂ 2,645 කින් හෙවත් සියයට 13 කින්ද, මිලදී ගත් හා වට්ටම් කළ බිල්පත් රුපියල් දශ ලක්ෂ 666 කින් හෙවත් සියයට 10 කින්ද ඉහළ නැඟුණි. මේ අතර, අතැති මුදල්, මහ බැංකුවේ තැන්පතු, විදේශීය ශේෂ, භාණ්ඩාගාර බිල්පත් සහ වට්ටම් කළ බිල්පත්වලින් සමන්විත ද්‍රවශීල වත්කම් රුපියල් දශ ලක්ෂ 12,055 කින් හෙවත් සියයට 43 කින් වර්ධනය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර බිල්පත් දැරීම් සහ විදේශීය ශේෂයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,124 කින් හෙවත් සියයට 84 කින් සහ රුපියල් දශ ලක්ෂ 4,470 කින් හෙවත් සියයට 59 කින් ඉහළ යාම හේතු විය.

1990 වසරේදී පෞද්ගලික අංශයට දෙනු ලැබූ මුළු වාණිජ බැංකු අත්තිකාරම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 14,465 කින් හෙවත් සියයට 22 කින් ඉහළ නැඟුණි. මේ හා සැසඳෙන 1989 වර්ෂයේ වර්ධනය රුපියල් දශ ලක්ෂ 5,400 ක් හෙවත් සියයට 9 කි. මුළු අත්තිකාරම් වලින් කෙටිකාලීන අත්තිකාරම්වල කොටස 1989 වර්ෂය අගදී සියයට 68 ක සිට 1990 වර්ෂය අවසානයේදී සියයට 66 දක්වා අඩු වූ අතර අවුරුදු 1 සිට අවුරුදු 5 දක්වා වූ මධ්‍යකාලීන අත්තිකාරම්වල කොටස මෙකී කාලසීමාව තුලදී සියයට 15 සිට සියයට 17 දක්වා වැඩි විය.

## 1 . 57 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු වත්කම් හා වගකීම්හි තෝරාගත් ශීර්ෂ 1989—1990

| ශීර්ෂය | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | | | |
|---|---|---|---|---|
| | මාසික සංඛ්‍යාවන්ගේ සාමාන්‍යය | | කාලච්ඡේදය අවසානයේදී | |
| | 1989 | 1990 | 1989 | 1990 |
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත ඇතුළත්ව) .. | 6,828 | 7,649 | 7,611 | 9,406 |
| විදේශීය ශේෂ .. | 7,994 | 9,201 | 7,607 | 12,077 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 5,289 | 8,893 | 6,113 | 11,237 |
| වට්ටම් කළ බිල්පත් .. | 6,112 | 6,579 | 6,703 | 7,368 |
| මුළු ද්‍රවශීල වත්කම් .. | 26,205 | 32,289 | 28,010 | 40,089 |
| මුළු ආයෝජන (අ) .. | 1,823 | 2,012 | 1,961 | 2,040 |
| මුළු ණය මුදල් සහ අයිරාවන් .. | 56,083 | 67,165 | 60,128 | 74,274 |
| ඉල්ලුම් තැන්පතු (ආ) .. | 18,343 | 22,529 | 21,439 | 26,880 |
| කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු (ඇ) .. | 46,115 | 56,295 | 50,256 | 63,664 |
| මුළු තැන්පතු .. | 64,458 | 78,823 | 71,695 | 90,544 |
| අනුපාතය .. | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට මුදල් .. | 37·2 | 34·0 | 35·5 | 35·0 |
| මුළු තැන්පතුවලට මුදල් .. | 10·6 | 9·7 | 10·6 | 10·4 |
| මුළු තැන්පතුවලට විදේශීය ශේෂ .. | 12·4 | 11·7 | 10·6 | 13·3 |
| මුළු තැන්පතුවලට භාණ්ඩාගාර බිල්පත් .. | 8·2 | 11·3 | 8·5 | 12·4 |
| මුළු තැන්පතුවලට වට්ටම් කළ වාණිජබිල්පත් | 9·5 | 8·3 | 9·3 | 8·1 |
| ඉල්ලුම් තැන්පතුවලට ද්‍රවශීල වත්කම් .. | 142·9 | 143·3 | 130·6 | 149·1 |
| මුළු තැන්පතුවලට ද්‍රවශීල වත්කම් .. | 40·7 | 41·0 | 39·1 | 44·3 |
| මුළු තැන්පතුවලට ආයෝජන .. | 2·8 | 2·6 | 2·7 | 2·3 |
| මුළු තැන්පතුවලට ණය මුදල් සහ අයිරාවන් | 87·0 | 85·2 | 83·9 | 82·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් සහ පෞද්ගලික සුරැකුම්පත්.

(ආ) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.

(ඇ) 1989 සහ 1990 වර්ෂයන්හි දී රාජ්‍ය බැංකු දෙක මගින් විශේෂ ඉතිරි කිරීමේ ගිණුම් ක්‍රමය යටතේ දිගු කාලීන තැන්පතු වශයෙන් රැස්කරන ලද පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,708 ක් සහ රුපියල් දශ ලක්ෂ 1,964 ක් ඉතිරි කිරීම් ඇතුළත් වේ.

සටහන:- මෙහි දක්වා ඇති සංඛ්‍යාවල සහ මෙම වාර්තාවෙහි ම වෙනත් ස්ථානයක දක්වා ඇති සංඛ්‍යාවල වෙනස්කම් ඇත්තේ අර්ථ නිරූපනයෙහි ඇති වෙනස්කම් හේතුවෙනි.

අපනයන, ආනයන සහ තොග හා සිල්ලර වෙළඳාම ඇතුලත් වන වාණිජ අරමුණු (මෙය විශාලතම අත්තිකාරම් කාණ්ඩයයි) සඳහා වූ අත්තිකාරම් කොටස 1989 වසර අගදී සියයට 48 ක සිට 1990 වසරේ තෙවන කාර්තුව අගදී සියයට 49 දක්වා වර්ධනය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන සහ ආනයන කාණ්ඩයන්ගේ වර්ධනයයි.

ඉංජිනේරු කටයුතු හා ගොඩනැගිලි තැනීම්, වෙළඳාම, කැනීම් සහ ධීවර කටයුතු ඇතුලත් වන කර්මාන්ත අරමුණු සඳහා වූ ණය ඉල්ලුම 1990 මුල් කාර්තු තුන තුලදී රුපියල් දශ ලක්ෂ 93 කින් තවදුරටත් පහත වැටුණි. 1989 වර්ෂයේදී ද කර්මාන්ත සඳහා වූ ණය ඉල්ලුම රුපියල් දශ ලක්ෂ 817 කින් හෙවත් සියයට 6 කින් පහත වැටී තිබුණි. ඒ අතර 1990 වර්ෂයේ තෙවන කාර්තුව අවසානයේදී කෘෂිකාර්මික අරමුණු සඳහා දෙනුලැබූ අත්තිකාරම් කොටස සියයට 9 ක මට්ටමෙහි නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද 1990 මුල් කාර්තු තුන තුලදී මුළු කෘෂිකාර්මික අත්තිකාරම් කොටස නිරපේක්ෂ වශයෙන් රුපියල් දශ ලක්ෂ 406 කින් හෙවත් සියයට 6 කින් ඉහළ ගියේය. මේ හා සැසඳෙන 1989 වර්ෂයේ වර්ධනය රුපියල් දශ ලක්ෂ 32 ක් හෙවත් සියයට 2.3 කි.

## 1 . 58 වැනි සංඛ්‍යා සටහන

### අරමුණු හා කල්පිරීම් රටාව අනුව වර්ග කරන ලද වාණිජ බැංකු අත්තිකාරම්* 1989–1990

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

| වර්ගීකරණය | කෙටි කාලීන (අවු. 1 ට අඩු) | | මැදි කාලීන (අවු. 1 සිට 5 දක්වා) | | දිගු කාලීන (අවු. 5 ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) (1), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (3) | (4) (3), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (5) | (6) (5), (7) හි ප්‍රතිශතයක් වශයෙන් | (7) | (8) (7) එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| **අ. වාණිජ** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 26,575·5 | 83·2 | 3,512·0 | 11·0 | 1,836·7 | 5·8 | 31,924·2 | 47·8 |
| 1990 මාර්තු | 28,017·2 | 83·6 | 3,708·5 | 11·1 | 1,798·2 | 5·4 | 33,523·9 | 48·9 |
| 1990 ජූනි | 28,597·4 | 84·3 | 3,489·5 | 10·3 | 1,818·3 | 5·4 | 33,905·2 | 48·1 |
| 1990 සැප්තැම්බර් | 30,643·7 | 82·1 | 4,846·2 | 13·0 | 1,816·2 | 4·9 | 37,306·1 | 49·4 |
| **ආ. මූල්‍ය** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 813·1 | 48·6 | 573·4 | 34·2 | 288·0 | 17·2 | 1,674·5 | 2·5 |
| 1990 මාර්තු | 894·9 | 50·1 | 641·1 | 35·9 | 250·6 | 14·0 | 1,786·6 | 2·6 |
| 1990 ජූනි | 1,051·8 | 54·5 | 616·4 | 31·9 | 263·2 | 13·6 | 1,931·4 | 2·7 |
| 1990 සැප්තැම්බර් | 1,159·9 | 61·2 | 439·1 | 23·2 | 296·1 | 15·6 | 1,895·1 | 2·5 |
| **ඇ. කෘෂිකාර්මික** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 3,042·8 | 46·2 | 906·3 | 13·8 | 2,632·3 | 40·0 | 6,581·4 | 9·9 |
| 1990 මාර්තු | 3,541·4 | 50·6 | 1,034·8 | 14·8 | 2,422·4 | 34·6 | 6,998·6 | 10·2 |
| 1990 ජූනි | 3,103·4 | 46·3 | 1,095·0 | 16·3 | 2,499·1 | 37·3 | 6,697·5 | 9·5 |
| 1990 සැප්තැම්බර් | 3,170·0 | 45·4 | 1,209·7 | 17·3 | 2,607·9 | 37·3 | 6,987·6 | 9·3 |
| **ඈ. කාර්මික**** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 11,991·1 | 75·0 | 2,432·0 | 15·2 | 1,557·0 | 9·7 | 15,980·1 | 23·9 |
| 1990 මාර්තු | 10,558·8 | 71·7 | 2,629·1 | 17·9 | 1,531·7 | 10·4 | 14,719·6 | 21·5 |
| 1990 ජූනි | 11,136·1 | 71·5 | 2,830·7 | 18·2 | 1,604·1 | 10·3 | 15,570·9 | 22·1 |
| 1990 සැප්තැම්බර් | 10,770·8 | 67·8 | 3,101·1 | 19·5 | 2,015·7 | 12·7 | 15,887·6 | 21·1 |
| **ඉ. සංචාරක** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 294·9 | 40·0 | 90·1 | 12·2 | 352·0 | 47·8 | 737·0 | 1·1 |
| 1990 මාර්තු | 293·3 | 39·5 | 90·5 | 12·2 | 357·8 | 48·2 | 741·6 | 1·1 |
| 1990 ජූනි | 299·0 | 39·1 | 84·9 | 11·1 | 381·5 | 49·8 | 765·4 | 1·1 |
| 1990 සැප්තැම්බර් | 339·6 | 43·0 | 80·5 | 10·2 | 369·6 | 46·8 | 789·7 | 1·0 |
| **ඊ. නිවාස** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 1,110·9 | 18·3 | 1,332·4 | 22·0 | 3,623·6 | 59·7 | 6,066·9 | 9·1 |
| 1990 මාර්තු | 1,246·4 | 18·9 | 1,389·2 | 21·1 | 3,954·8 | 60·0 | 6,590·4 | 9·6 |
| 1990 ජූනි | 1,240·9 | 17·8 | 1,526·8 | 21·9 | 4,200·1 | 60·3 | 6,967·8 | 9·9 |
| 1990 සැප්තැම්බර් | 1,309·6 | 17·2 | 1,700·8 | 22·4 | 4,591·6 | 60·4 | 7,602·0 | 10·1 |
| **උ. පරිභෝජන** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 970·8 | 63·8 | 431·1 | 28·3 | 120·7 | 7·9 | 1,522·6 | 2·3 |
| 1990 මාර්තු | 1,026·0 | 62·8 | 475·0 | 29·1 | 132·0 | 8·1 | 1,633·0 | 2·4 |
| 1990 ජූනි | 1,173·2 | 62·4 | 565·0 | 30·1 | 141·4 | 7·5 | 1,879·6 | 2·7 |
| 1990 සැප්තැම්බර් | 1,147·9 | 60·1 | 583·0 | 30·5 | 180·5 | 9·4 | 1,911·4 | 2·5 |
| **ඌ. අනෙකුත් ණය** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 902·8 | 40·1 | 721·6 | 32·0 | 627·4 | 27·9 | 2,251·8 | 3·4 |
| 1990 මාර්තු | 1,092·4 | 42·9 | 777·8 | 30·5 | 678·6 | 26·6 | 2,548·8 | 3·7 |
| 1990 ජූනි | 1,323·0 | 47·3 | 714·4 | 25·6 | 757·4 | 27·1 | 2,794·8 | 4·0 |
| 1990 සැප්තැම්බර් | 1,310·0 | 42·4 | 874·9 | 28·3 | 906·0 | 29·3 | 3,090·9 | 4·1 |
| **එ. එකතුව** | | | | | | | | |
| 1989 දෙසැම්බර් | 45,701·9 | 68·5 | 9,993·9 | 15·0 | 11,037·7 | 16·5 | 66,738·5 | 100·0 |
| 1990 මාර්තු | 46,670·4 | 68·1 | 10,746·0 | 15·7 | 11,126·1 | 16·2 | 68,542·5 | 100·0 |
| 1990 ජූනි | 47,924·8 | 68·0 | 10,922·7 | 15·5 | 11,665·1 | 16·5 | 70,512·6 | 100·0 |
| 1990 සැප්තැම්බර් | 49,851·5 | 66·1 | 12,835·3 | 17·0 | 12,783·6 | 16·9 | 75,470·4 | 100·0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

* අත්තිකාරම් චලව සංසරණයෙහි පවත්නා මුදල් ශීර්ෂයන් හැර ණය, අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත්ය.

** ඉංජිනේරු සහ ගොඩනැගිලි ව්‍යාපාර, කැනීම් සහ ධීවර කර්මාන්තය සඳහා දෙන ලද අත්තිකාරම් ඇතුළත් වේ.

## අරමුදල් ලබාගත් මූලාශ්‍ර සහ උපයෝගීකරණය

අතීත ප්‍රවණතාවයනට වෙනස්ව 1990 වසරේදී අනෙකුත් දේශීය පෞද්ගලික අංශය වාණිජ බැංකු අරමුදල් ශුද්ධ වශයෙන් භාවිතා කිරීමේ ප්‍රධාන අංශයක් බවට පත්විය. එම අංශය වසර තුලදී රුපියල් දශ ලක්ෂ 1,403 ක් ශුද්ධ වශයෙන් භාවිතා කර තිබුණි. පසුගිය වසරේදී ශුද්ධ පදනමක් මත මෙම අංශය වාණිජ බැංකුවලට අරමුදල් සැපයීමේ ප්‍රධානතම මූලාශ්‍රයව පැවතුණි. මෙම වෙනසට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එම අංශයෙහි තැන්පතු රුපියල් දශ ලක්ෂ 10,869 කින් වැඩිවීම හා සලකන කල ණයදීම් රුපියල් දශ ලක්ෂ 8,489 කින් සහ අයිරාවන් රුපියල් දශ ලක්ෂ 3,317 කින් වැඩිවීමය. එලෙසම ශුද්ධ පදනමක් යටතේ රුපියල් දශ ලක්ෂ 2,448 ක වාණිජ බැංකුවල අරමුදල් භාවිතා කරමින්, රාජ්‍ය අංශය වාණිජ බැංකුවල අරමුදල් භාවිතා කරන්නකු බවට පත්විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ වාණිජ බැංකු සතුව පැවති රජයේ සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 5,255 කින් ඉහළයාම සහ රජයේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,871 කින් අඩුවීමය. තවද, වර්ෂය තුලදී රජය විසින් භාවිතා කරන ලද කෙටිකාලීන ණය රුපියල් දශ ලක්ෂ 977 කින් ඉහළ ගියේය.

### 1.59 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු තම සම්පත් ලබාගත් මාර්ග සහ ඒවා යෙදවූ මාර්ග 1988 — 1990

(රුපියල් දශ ලක්ෂ)

| අංශය සහ විස්තර විශ්ලේෂණය | 1988 අවසානයේ සිට 1989 අවසානය දක්වා | | 1989 අවසානයේ සිට 1990 අවසානය දක්වා | |
|---|---|---|---|---|
| | මූලය | භාවිතය | මූලය | භාවිතය |
| 1. රාජ්‍ය අංශය | **999·5** | — | — | **2,447·6** |
| රජයේ සුරැකුම්පත් දැරීම | — | 1,332·6 | — | 5,255·0 |
| තැන්පතු | 1,127·1 | — | 3,871·4 | — |
| ආනයන බිල්පත් | 170·1 | — | — | 87·5 |
| කෙටි කාලීන ණය | 1,031·9 | — | — | 976·5 |
| අයිරාවන් | 3·0 | — | — | — |
| 2. මහ බැංකුව | — | **668·9** | **879·6** | — |
| ණය ගැනීම් | 139·4 | — | 2,675·3 | — |
| සංචිත | — | 1,357·4 | — | 1,496·7 |
| මහ බැංකු සුරැකුම්පත්හි ආයෝජන | 143·7 | — | — | — |
| කැට මුදල් | 405·4 | — | — | 299·0 |
| 3. රාජ්‍ය සංස්ථා | — | **3,621·9** | — | **483·9** |
| තැන්පතු | — | 546·2 | 1,290·2 | — |
| අත්තිකාරම් | — | 3,075·7 | — | 1,774·1 |
| 4. සමුපකාර | **233·7** | — | — | **359·7** |
| තැන්පතු | 92·8 | — | 58·8 | — |
| අත්තිකාරම් | 140·9 | — | — | 418·5 |
| 5. අනෙකුත් දේශීය පෞද්ගලික අංශය | **570·9** | — | — | **1,402·9** |
| තැන්පතු | 5,036·1 | — | 10,869·2 | — |
| දේශීය බිල්පත් | 8,169·7 | — | — | 454·8 |
| ආනයන බිල්පත් | 1,561·7 | — | — | 63·7 |
| අයිරාවන් | — | 576·5 | — | 3,316·7 |
| ණය මුදල් | — | 3,601·2 | — | 8,488·8 |
| සුරැකුම් පත් හා බැඳුම්කරවල ආයෝජන | — | 18·9 | 51·9 | — |
| 6. අන්තර් බැංකු ගණුදෙනු | — | **885·3** | **622·5** | — |
| දේශීය බැංකුවල ඇති ශේෂයන් | — | 1,384·7 | 40·5 | — |
| දේශීය බැංකුවල තැන්පතු හා ණය ගැනීම් | 499·4 | — | 582·0 | — |
| 7. විදේශීය අංශය | — | **321·6** | — | **2,477·7** |
| ණය ගැනීම් | 112·9 | — | — | 24·1 |
| තැන්පතු | 1,443·3 | — | 2,760·3 | — |
| අපනයන බිල්පත් ද ඇතුළුව විදේශීය ශේෂයන් | — | 1,877·8 | — | 5,213·9 |
| 8. අනෙකුත් වත්කම් හා අනෙකුත් වගකීම් | — | **1,306·4** | **5,669·7** | — |
| ප්‍රාග්ධන හා සංචිත | 620·7 | — | 1,295·8 | — |
| ස්ථාවර හා අනෙකුත් වත්කම් | — | 939·0 | 1,740·7 | — |
| අනෙකුත් වගකීම් | — | 988·1 | 2,633·2 | — |
| මුළු ශුද්ධ සම්පත් ලැබීම්/භාවිතය | 6,804·1 | | 7,171·8 | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

විශේෂ ඉතිරි කිරීමේ ක්‍රමය යටතේ රාජ්‍ය අංශයේ බැංකු දෙක විසින් යොදවන ලද දිගු කාලීන තැන්පතු ද ඇතුළත් වේ.

සටහන: කළු අකුරින් දක්වා ඇති සංඛ්‍යාවන්ගෙන් එක් එක් අංශයෙහි මුළු ශුද්ධ සම්පත් ලැබීම් හෝ භාවිතය දක්වේ.

## 1 . 60 සංඛ්‍යා සටහන

## ඉතිරිකිරීම් රාශිකරණය 1986 – 1990

රුපියල් දශ ලක්ෂ

| වර්ෂය | වාණිජ බැංකු | | | | | | වාණිජ බැංකු නොවන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දේශීය | | විදේශීය | | ප්‍රා. ග්‍රා. ස. බැ. | | ග්‍රාමීය බැංකු | | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | කෘෂි සේවා මධ්‍යස්ථාන | |
| | ඉතිරි කිරීම් | ස්ථාවර | ඉතිරිකිරීම් | ස්ථාවර | ඉතිරි කිරීම් | ස්ථාවර | ඉතිරි කිරීම් | ස්ථාවර | ඉතිරි කිරීම් | ස්ථාවර (අ) | ඉතිරි කිරීම් | ස්ථාවර |
| 1986 . | 11,127 | 14,341 | 1,084 | 7,322 | 16 | 5 | 1,122 | 174 | 4,326 | 9,875 | 111 | 38 |
| 1987 . | 13,179 | 15,606 | 1,325 | 8,382 | 44 | 9 | 1,371 | 189 | 5,172 | 11,229 | 133 | 36 |
| 1988 . | 16,240 | 15,476 | 1,731 | 8,371 | 90 | 14 | 1,713 | 195 | 6,381 | 11,684 | 146 | 34 |
| 1989 . | 20,572 | 17,109 | 1,942 | 8,925 | 145 | 31 | 2,023 | 189 | 7,921 | 12,035 | 152 | 35 |
| 1990 . | 25,347 | 25,099 | 1,965 | 9,289 | 269 | 45 | (ඈ) 2,241 | (ඈ) 208 | (ආ) 8,408 | (ආ) 13,580 | (ඈ) 169 | (ඈ) 22 |

මූලය ; ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) අනෙකුත් තැන්පතු ඇතුළත්ය.
(ආ) තාවකාලික.
(ඈ) 1990 සැප්. 30 දිනට.

මෙයට අමතරව, විදේශීය අංශයද ශුද්ධ පදනමක් මත වාණිජ බැංකු අරමුදල් භාවිතා කරන ප්‍රධාන අංශයක් බවට පත් විය. එම අංශය මගින් සිදු කළ මුළු ශුද්ධ සම්පත් උපයෝජනය රුපියල් දශ ලක්ෂ 2,478 කි. අරමුදල් භාවිතා කිරීම සළකා බලන විට විදේශීය ශේෂයන් ලෙස සැළකෙණ අපනයන බිල්පත් සහ ණයට ගැනීම් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 5,214 හා රුපියල් දශ ලක්ෂ 24 බැගින් විය. කෙසේ වුවද, වසර තුලදී මෙම අංශයෙහි තැන්පතු රුපියල් දශ ලක්ෂ 2,760 කින් වර්ධනය වීම මගින් අරමුදල්වල ශුද්ධ උපයෝජනය පහළ හෙලන ලදී.

මේ අතර ශුද්ධ පදනමක් මත රුපියල් දශ ලක්ෂ 5,670 කින් වර්ධනය වූ අනෙකුත් වත්කම් සහ වගකීම් 1990 වර්ෂයේදී වාණිජ බැංකුවලට අරමුදල් සැපයූ ප්‍රධාන මූලාශ්‍රයක් විය. මෙය 1989 දී ශුද්ධ පදනමක් මත රුපියල් දශ ලක්ෂ 1,306 කින් වාණිජ බැංකු අරමුදල් භාවිතා කිරීමේ ප්‍රධාන උපයෝජන කාණ්ඩයක්ව පැවතීමට ප්‍රතිවිරුද්ධ වූවකි.

වාණිජ බැංකු ක්‍රමය සහ අනෙකුත් ඉතිරිකිරීම් ආයතන විසින් රාශීකරණය කරනු ලැබූ මුලු තැන්පතු ප්‍රමාණය 1989 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 70,966 ක සිට 1990 වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 86,642 දක්වා ඉහළ ගියේය. මෙය සියයට 22 ක වර්ධනයකි. දේශීය වාණිජ බැංකු මුලු තැන්පතු වලින් සියයට 58 ක් රාශීකරණය කළ අතර, විදේශීය බැංකු මුළු තැන්පතු වලින් සියයට 13 ක් රාශීකරණය කරන ලදී. 1990 වසර තුලදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව මුළු තැන්පතු වලින් සියයට 25 ක් රාශීකරණය කර තිබුණි. තැන්පතු වෙන් වෙන්ව සළකන කල 1990 අගදී මුළු තැන්පතු වලින් සියයට 56 ක් ස්ථාවර තැන්පතු මගින් නියෝජනය කෙරිණි. මෙමගින් ස්ථාවර තැන්පතුවල කොටස පසුගිය වසරට වඩා ප්‍රතිශත අංක දෙකකින් ඉහළ නැගුනි. මෙය අඩු පොළියක් ලැබෙන ඉතුරුම් තැන්පතුවලට එරෙහිව වැඩි පොලියක් ලැබෙන ස්ථාවර තැන්පතු කෙරෙහි ඉතිරි කරන්නන්ගේ ප්‍රතිචාරය එක්තරා අයුරකින් පිළිබිඹු වීමකි.

**බැංකු සේවා පහසුකම් ව්‍යාප්තිය**

**ශාඛා ව්‍යාප්තිය**

වාණිජ බැංකු කටයුතුවල නියැලෙන මුළු ආයතන සංඛ්‍යාව 36 දක්වා ඉහළ නංවමින් 12 වැනි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව (ප්‍රා. ග්‍රා. සං. බැ.) 1990 ඔක්තෝබර් මස බදුල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටුවනු ලැබීය. වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ වාණිජ බැංකු සංඛ්‍යාව (ප්‍රා. ග්‍රා. සං. බැංකු හැර) 24 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, පසුගිය වසර හා සසඳන විට 1990 වර්ෂයේ දී සියලුම බැංකු ආයතනවල ශාඛා ව්‍යාප්තිය ඉහළ පරිමාණයක පැවතුණි. (1.61 සංඛ්‍යා සටහන) වර්ෂය අවසානයේදී මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 918 දක්වා ඉහළ නංවමින් 1990 වර්ෂයේදී ශාඛා 48 ක් පිහිටුවනු ලැබීය. මෙයට දේශීය වාණිජ බැංකු ශාඛා 28 ක්, විදේශීය වාණිජ බැංකු ශාඛා 2 ක්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 11 ක් සහ ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා (ජා. ඉ. බැ.) 7 ක් ඇතුළත් විය. රටේ බොහෝ ප්‍රදේශවල ආරක්ෂක තත්ත්වය වර්ධනය වීමත් සමග මූල්‍ය ආයතන අතර වර්ධනය වූ තරඟකාරිත්වය බැංකු ශාඛා ජාලයෙහි සැළකිය යුතු ව්‍යාප්තිය තුළින් පිළිබිඹු විය.

ලංකා බැංකුව ශාඛා 5 ක් ඉමදූව, පිළියන්දල, හංවැල්ල, දික්වැල්ල සහ දිගන යන ස්ථානයන්හි පිහිටුවන ලදී. 1990 වර්ෂයෙහිදී ලංකා බැංකුව එහි මාන්කුලම හා කින්නියා ශාඛා සහ කොබෙයිගනේ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛාව යළි විවෘත කරන ලද අතර, වලස්ගල ශාඛාව සහ පඹගින්න, කෝදගොඩ, කිඹිස්ස සහ වැලිගම කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා වසා දමනු ලැබීය. මේ අතර ලංකා බැංකුව ගලහ, මතුරට, කුරුවිට සහ අයගම පිහිටි කෘෂි සේවා මධ්‍යස්ථාන 4 ක් අධි ශ්‍රේණිගත කරන ලදී. මෙයට අමතරව ශාඛා සුදුසු පරිදි ස්ථානගත කිරීමේ වැඩ සටහන යටතේ ලංකා බැංකුව ශාඛා 7 ක් සහ කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 5 ක් වර්ෂය තුලදී ප්‍රතිස්ථානගත කරන ලදී, මේ අනුව, 1990 වර්ෂය අවසානයේදී ලංකා බැංකුවේ මුළු ප්‍රධාන ශාඛා සංඛ්‍යාව 247 දක්වා ඉහළ නැගුන අතර, කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 38 දක්වා

පහත වැටුනි. වර්ෂය තුලදී, මහජන බැංකුව ශාඛා 3 ක් මාරවිල, පානදුර සහ ආයතනික ශාඛාව ප්‍රධාන කාර්යාලයේදී විවෘත කිරීමත්, කින්නියා සහ මහඔය ශාඛා යලි විවෘත කිරීමත් සමග වර්ෂය අවසාන වනවිට එහි ක්‍රියාකාරී ශාඛා සංඛ්‍යාව 306 දක්වා ඉහළ නැගුණි.

මේ අතර, සීමාසහිත සෙලාන් බැංකුව වර්ෂය තුලදී රත්නපුර, කොල්ලුපිටිය, මොරටුව, කෑගල්ල, නුගේගොඩ, ගම්පහ, මීගමුව, දෙහිවල, හලාවත, ගාල්ල සහ මහනුවර වශයෙන් නව ශාඛා 11 ක් විවෘත කරන ලදී. සීමාසහිත ලංකා වාණිජ බැංකුව, බොරැල්ල, නුගේගොඩ සහ කෑගල්ල යන ස්ථානයන්හි නව ශාඛා 3 ක් පිහිටු විය. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, පිලියන්දල, හලාවත සහ බම්බලපිටියේ නව ශාඛා 3 ක් සහ කටුනායක ගුවන් තොටුපලේ ගෙවීම් කාර්යාලයක් ද විවෘත කළේය. සීමාසහිත සම්පත් බැංකුව, වත්තල සහ මාතර නව ශාඛා 2 ක් විවෘත කරන ලදී. මේ අනුව, 1990 වර්ෂය අවසානයේදී සෙලාන් බැංකුවේ, ලංකා වාණිජ බැංකුවේ, හැටන් නැෂනල් බැංකුවේ සහ සම්පත් බැංකුවේ මුළු ශාඛා සංඛ්‍යාව පිළිවෙලින් 17, 19, 39 සහ 13 දක්වා ඉහළ නැගුනි. මේ අතර, සීමාසහිත හබීබ් බැංකුව එහි නවම් මාවත ශාඛාව සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව එහි කොල්ලුපිටිය ශාඛාව 1990 වර්ෂය තුලදී විවෘත කරන ලදී.

**1 . 61 සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා ව්‍යාප්තිය 1988 – 1990**

| වර්ගීකරණය | 1988 | 1989 | 1990 |
|---|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව .. | 36 | 35 | 36 |
| 1.1 වාණිජ බැංකු සංඛ්‍යාව .. | 25 | 24 | 24 |
| 1.1.1 දේශීය බැංකු සංඛ්‍යාව .. | 06 | 06 | 06 |
| 1.1.2 විදේශීය බැංකු සංඛ්‍යාව .. | 19 | 18 | 18 |
| 1.2 ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව (අ) .. | 11 | 11 | 12 |
| 2. ශාඛා සංඛ්‍යාව* .. | 844 | 869 | 918 |
| 2.1 වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව .. | 700 | 711 | 742 |
| 2.1.1 දේශීය බැංකු ශාඛා සංඛ්‍යාව (ආ) .. | 678 | 690 | 719 |
| 2.1.1.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව .. | 47 | 45 | 38 |
| 2.1.2 විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව .. | 22 | 21 | 23 |
| 2.2 ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා සංඛ්‍යාව .. | 80 | 89 | 100 |
| 2.3 ජාතික ඉතිරි කිරීමේ බැංකු ශාඛා සංඛ්‍යාව .. | 64 | 69 | 76 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු.

(ආ) ව්‍යාප්ති කාර්යාල, කච්චේරි ශාඛා, ගෙවීම් කාර්යාල සහ විදේශීය ශාඛා ඇතුළත්ය. එහෙත් ප්‍රධාන ශාඛාවන්ට අනුබද්ධිත් ව්‍යාප්ත කාර්යාල වශයෙන් පවත්නා ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා ඇතුළත් නොවේ.

*ප්‍රධාන කාර්යාල ඇතුළත් නොවේ.

විමර්ශනයට ලක් වූ වර්ෂය තුළදී ජාතික ඉතිරිකිරීමේ බැංකුව, වැල්ලවත්ත, පිලියන්දල, චුන්නාකම්, චාවාකච්චේරි, ගම්පොළ, කඩවත සහ මාලිගාවත්ත යන ස්ථානයන්හි නව ශාඛා 7 ක් විවෘත කිරීමත් සමග 1990 වර්ෂය අවසානයේදී එහි මුළු ශාඛා සංඛ්‍යාව 76 දක්වා ඉහළ නැගුණි. මේ අතර වර්ෂය තුළදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ඒවායේ ශාඛා 11 පිහිටු වීමෙන් පසු එකී බැංකුවල මුළු ශාඛා සංඛ්‍යාව වර්ෂය අවසානයේදී 100 දක්වා ඉහළ නැගුණි. එපමණක් නොව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සිය සේවා කටයුතු වර්ධනය කිරීමේ අරමුණින් එහි ප්‍රථම ශාඛාව මහනුවරදී විවෘත කරනු ලැබීය.

## විශේෂ ණය යෝජනා ක්‍රම

ආයුර්වේද වෛද්‍යවරුන් සහ නීතිවේදීන් වැනි වෘත්තිකයන් ද ඇතුළත් කර ගැනීමට එහි ආවරණය පුළුල් කරමින් වර්ෂය තුළදී මහජන බැංකුව සිය ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය තවදුරටත් ව්‍යාප්ත කළ අතර, සුළු පරිමාණ අපනයනකරුවන්ගේ නිෂ්පාදන ඒකක පිහිටුවීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වන ප්‍රාථමික වියදම් සපුරා ගැනීමට නව ණය යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දෙනු ලැබීය. තවද, මහජන බැංකුව ගණුදෙනුකරුවන්ගේ ගැටළු නිරාකරණය කිරීමේ හා ගණුදෙනුකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීමේ අරමුණ ඇතිව සෑම මාසයකම පැවැත්වෙන පරිදි ගණුදෙනුකරුවන්ගේ දිනයක් හඳුන්වා දෙනු ලැබීය. එයට අමතරව, ජාතික සංවර්ධන බැංකුව සුමක ණය ක්‍රමය යටතේ බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමයක් දියත් කළේය. මැද පෙරදිග රටවල සේවයට යන ශ්‍රී ලාංකිකයන්ට උපකාරී වීමේ අරමුණ ඇතිව ලංකා බැංකුව නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. මේ අතර, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදලින් සහන කොන්දේසි මත ලැබුන ණය මුදල් උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු මාර්ගයෙන් දිස්ත්‍රික්ක කිහිපයක වෙසෙන ඉතාමත් දිළිඳු ජනතාවට ඇප රහිත ණය ලබාගත හැකි නව ණය යෝජනා ක්‍රමයක් මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබීය. කෘෂිකර්මය, සත්ව පාලනය සහ කුඩා කර්මාන්ත වැනි ස්වයං ව්‍යාපෘතීන් යටතේ නියැලෙන සුළු ගොවීන් සහ ඉඩම් නොමැති වූවන්ට සහායවීම සඳහා ද මහ බැංකුව විසින් තවත් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දුනි.

## බැංකු කටයුතු සිදු කෙරෙන කාලය දීර්ඝ කිරීම

ගණුදෙනුකරුවන්ගේ ඉල්ලුම සහ දැඩි තරගකාරීත්වයට ප්‍රතිචාර වශයෙන් 1990 වර්ෂයේදී වාණිජ බැංකු කිහිපයක්ම සිය බැංකු කටයුතු සිදුකරන කාලසීමාව දීර්ඝ කරන ලදී. බැන්ක් ඉන්දුසුවස් එහි ගණුදෙනු සිදු කෙරෙන කාලය පස්වරු 2.30 දක්වා දීර්ඝ කරන ලදී. සීමාසහිත සෙලාන් බැංකුව සිය බැංකු කටයුතු සිදු කෙරෙන කාලය පස්වරු 8.00 දක්වා දීර්ඝ කරමින් එහි ආයතනික සහ කොල්ලුපිටිය ශාඛාවල රාත්‍රී බැංකු සේවය හඳුන්වා දෙනු ලැබීය. ලංකා බැංකුව සහ මහජන බැංකුව ද පිළිවෙලින් ශාඛා 25 ක් සහ 15 ක ගණුදෙනු කාලසීමාවන් පස්වරු 4.00 දක්වා දීර්ඝ කරන ලදී. මේ අතර ලංකා බැංකුව තෝරාගත් කලාපයන් සඳහා ප්‍රථම ශනි දින සේවය හඳුන්වා දෙනු ලැබීය. මේ අනුව මධ්‍යම, උතුරුමැද සහ නැගෙනහිර යන කලාපවල ලංකා බැංකු ශාඛා සෑම මාසයකම ප්‍රථම සෙනසුරාදා දිනයේ ගණුදෙනු කටයුතු සඳහා දහවල් 12 දක්වා විවෘත කර තබනු ලැබේ. ග්‍රින්ලේස් බැංකුව ස්වකීය ප්‍රධාන ශාඛාවේ ගණුදෙනු කටයුතු පෙරවරු 8.30 ට ආරම්භ කිරීමට පටන් ගත් අතර සීමාසහිත ලංකා වාණිජ බැංකුව තෝරාගත් ශාඛාවන් කිහිපයක සේවා කාලය පස්වරු 3.00 දක්වා දීර්ඝ කරනු ලැබීය.

## නියෝජිත බැංකු

විමර්ශනයට ලක් වූ වර්ෂය තුලදී ලංකා බැංකුව හා මහජන බැංකුව 1988 දී හඳුන්වා දෙනු ලැබූ ප්‍රජා ණය නියාමක යෝජනා ක්‍රමය යටතේ වූ කටයුතු දිගටම කරගෙන යන ලදී. මේ අනුව, 1990 දී ලංකා බැංකුව ප්‍රජා ණය නියාමකයන් 930 ක් පත්කිරීමෙන් පසුව 1990 වර්ෂය අවසානයේදී මුළු ප්‍රජා ණය නියාමකයන්ගේ සංඛ්‍යාව 3,636 දක්වා වැඩි විය. ලංකා බැංකුව විසින් වර්ෂය තුලදී ප්‍රජා ණය නියාමකයන්ට අනුමත කළ මුළු අයිරාවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 107 ක් විය. මේ අතර මහජන බැංකුව ප්‍රජා ණය නියාමකයන් 2,373 ක් පත්කර ගැනීමෙන් පසු 1990 වර්ෂය අවසානයේදී එහි මුළු ප්‍රජා ණය නියාමකයන් සංඛ්‍යාව 6,701 දක්වා වැඩි විය. විමර්ශනයට ලක් වූ වර්ෂය තුළ මහජන බැංකුව ප්‍රජා ණය නියාමකයන් වෙත රුපියල් දශ ලක්ෂ 97 ක් දීම හේතුවෙන් 1990 වර්ෂය අවසානයේදී ප්‍රජා ණය නියාමක ක්‍රමය යටතේ නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 158 දක්වා වැඩි විය.

සීමාසහිත සම්පත් බැංකුව සම්පත් සේවා සංයෝජකයන් 59 ක් පත්කර ගැනීමෙන් පසු 1990 වර්ෂය අවසානයේදී මුළු සම්පත් සේවා සංයෝජක සංඛ්‍යාව 105 දක්වා ඉහළ නැගුනි. 1990 දෙසැම්බර් මාසය අවසානය දක්වා සීමාසහිත සම්පත් බැංකුව සම්පත් සේවා සංයෝජක යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරනු ලැබූ මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 20 ක් වූ අතර, 1990 වර්ෂය අවසානයේදී නොපියවා පැවති මුළු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11 කි.

**සේවා සහ ඉතිරි කිරීමේ පහසුකම්**

ලංකා බැංකුව මිලදී ගත් අයට හෝ නම් කරනු ලැබූවකුට, නගර අතර මුදල් හුවමාරු කර ගැනීමේ පරමාර්ථය සඳහා පැවරිය නොහැකි ''දුටුවන ගෙවීමේ අණකර'' නම් වූ මුදල් හුවමාරු උපකරණයක් හඳුන්වා දෙන ලදී.

සම්ප්‍රදායික නොවන අපනයන කටයුතුවල නියැලෙන සුළු අපනයනකරුවන්ට ගාස්තු අය කිරීමකින් තොරව උපදේශක සේවාවක් පවත්වාගෙන යාම අරමුණු කොටගෙන ලංකා බැංකුව වෙළඳ ප්‍රවර්ධන සහ අපනයන උපදේශක සේවා ඒකකයක්ද විවෘත කරන ලදී. එපමණක් නොව, ලංකා බැංකුව එයාර් ලංකා සමාගමේ සහයෝගිත්වය ඇතිව විශේෂයෙන් විදේශිකයනට ඉතා කාර්‍යක්ෂම ප්‍රවාහන පහසුකම් සැපයීමට ''සී බැන්ක් ට්‍රැවල් සෙන්ටර්'' නමැති ආයතනය පිහිටුවන ලදී.

මහජන බැංකුව විසින් වගා ණය ලබාගැනීමට හා ඉතුරුම් තැන්පතු මත චෙක්පත් භාවිතා කළහැකි වන පරිදි ''මහජන ගොවිපත'' නමින් ණය කාඩ් ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. වීසා ඉන්ටර් නැෂනල් සමාගමේ හිමිකම යටතේ ''පීපල්ස් කාඩ්'' යනුවෙන් ණය කාඩ් ක්‍රමයක් ද මහජන බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව ක්ලැසික් කාඩ්, ගෝල්ඩ් කාඩ්, බිස්නස් කාඩ් දේශීය ගණුදෙනු සඳහා හඳුන්වා දෙනු ලැබූ අතර, ''ඉන්ටර් නැෂනල් කාඩ්'' ජාත්‍යන්තර ගණුදෙනු සඳහා හඳුන්වා දුනි.

ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර කාඩ් ක්‍රමයක් වූ 'මනි ලින්ක්' හඳුන්වා දෙනු ලැබූ අතර, සීමාසහිත ලංකා වාණිජ බැංකුව විසින් 'කැට්' නම් වූ ස්වයංක්‍රිය ටෙලර් කාඩ් ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. සීමාසහිත සම්පත් බැංකුව සහ සීමාසහිත සෙලාන් බැංකුව පිළිවෙලින් 'ළමා ඉතිරි කිරීමේ ගිණුම්' සහ 'ළමා ආරක්ෂණ ගිණුම්' නම් වූ බාල වයස්කරුවන් සඳහා නව තැන්පතු ක්‍රම 2 ක් හඳුන්වා දෙන ලදී. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 'විශේෂ ඉතිරිකිරීම් සහතිකපත' නම් වූ නව ඉතිරිකිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. මේ අතර, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහ බැංකුව විසින් භාණ්ඩාගාර තැන්පතු සහතික සහ ජාතික ආරක්ෂක පිළිනපත් නම් නව ආයෝජන උපකරණයන් දෙකක් නිකුත් කරනු ලැබීය.

**ග්‍රාමීය බැංකු කටයුතු සහ ණය**

විශේෂ ණය ක්‍රම යටතේ ග්‍රාමීය පදනමකින් යුතු ආර්ථික කටයුතු සඳහා ආයතනික ණය පහසුකම් සැපයීම 1990 වසර පුරා තවදුරටත් ක්‍රියාත්මක විය. ග්‍රාමීය අංශය වෙත ගලා යන ණය ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව 1990 වර්ෂයේ දී දිප ව්‍යාප්ත ස්වයං රැකියා ණය ක්‍රමය හඳුන්වා දුන් අතර නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමයට (න.ස.ග්‍රා.ණ.ක්‍ර.) සහභාගි වීම සඳහා සංවර්ධන ණය සැපයුම් ආයතන දෙකක් වන ජාතික සංවර්ධන බැංකුව සහ සංවර්ධන මූල්‍ය සමායතනයට අනුමැතිය ලබා දෙන ලදී. මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රවණතාවන් සහ පොළී අනුපාතික සැළකිල්ලට ගනිමින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අදාළ වන පොළී අනුපාතිකයන් සහ පරිමාණයන් 1990 වසරේ දී ඉහළ නැංවුණි.

## 1 . 62 සංඛ්‍යා සටහන

### නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද වගා ණය
### (1990.12.31. දිනට තත්ත්වය)

රුපියල් දශ ලක්ෂ

| වගා කන්නය | මහජන බැංකුව | | | ලංකා බැංකුව | | | හැටන් නැෂනල් බැංකුව | | | ප්‍රා. ග්‍රා. සං. බැංකුව | | | ලංකා වාණිජ බැංකුව | | | ස.මූ.ස. | | | දෙන ලද මුළු ණය | | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රම යටතේ දෙන ලද මුළු ණය ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | එකතුව | වී | අතුරු ආහාර භෝග | |
| 1988/89 මහ | 55·4 | 7·1 | 62·5 | 49·4 | 29·2 | 78·6 | 5·7 | 0·3 | 6·0 | 9·0 | 1·3 | 10·3 | — | — | — | — | — | — | 119·5 | 37·9 | 157·4 |
| 1989 යල | 29·9 | 11·9 | 41·8 | 45·7 | 22·7 | 68·4 | — | 0·4 | 0·4 | 4·9 | 3·0 | 14·9 | — | — | — | — | — | — | 87·5 | 38·0 | 125·5 |
| 1989 වගා වර්ෂය | 85·3 | 19·0 | 104·3 | 95·1 | 51·9 | 147·0 | 5·7 | 0·7 | 6·4 | 20·9 | 4·3 | 25·2 | — | — | — | — | — | — | 207·0 | 75·9 | 382·9 |
| 1989/1990 මහ | 76·4 | 17·5 | 93·9 | 92·2 | 59·5 | 151·7 | 13·7 | 2·9 | 16·6 | 23·2 | 13·9 | 37·1 | — | — | — | — | — | — | 205·5 | 93·8 | 299·3 |
| 1990 යල | 54·1 | 47·9 | 102·0 | 71·4 | 41·1 | 112·5 | 1·5 | 8·2 | 9·7 | 28·1 | 29·1 | 57·2 | — | 0·1 | 0·1 | — | 1·0 | 1·0 | 155·1 | 127·4 | 282·5 |
| 1990 වගා වර්ෂය | 130·5 | 65·4 | 195·9 | 163·6 | 100·6 | 264·2 | 15·2 | 11·1 | 26·3 | 51·3 | 43·0 | 94·3 | — | 0·1 | 0·1 | — | 1·0 | 1·0 | 360·6 | 221·2 | 581·8 |

මූලාශ්‍ර : මහජන බැංකුව
ලංකා බැංකුව
හැටන් නැෂනල් බැංකුව
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
ලංකා වාණිජ බැංකුව
සංවර්ධන මූල්‍ය සමායතනය

**නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය (න.ස.ග්‍රා.ණ.ක්‍ර.)**

පසුගිය වර්ෂයේ වූ නැමියාවට එරෙහිව යමින් න.ස.ග්‍රා.ණ. ක්‍රමය යටතේ 1990 වර්ෂය තුළදී ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය සියයට 106 කින් වැඩි වීමක් පෙන්නුම් කරමින් රුපියල් දශ ලක්ෂ 582 ක් විය. 1989/90 මහ කන්නයේ දී ප්‍රදානය කරන ලද රුපියල් දශ ලක්ෂ 299 ක් වූ ණය ප්‍රමාණය පසුගිය මහ කන්නයට වඩා සියයට 90 ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, 1990 යල කන්නය තුළ දී සපයන ලද රුපියල් දශ ලක්ෂ 283 ක ණය ප්‍රමාණය 1989 යල කන්නයට වඩා සියයට 125 ක වැඩි වීමක් වාර්තා කළේය. රටේ වැඩි කොටසක ආරක්ෂක තත්ත්වය යහපත් අතට හැරීමත් සමඟ ආර්ථික කටයුතු යථා තත්වයට පත්වීමත්, බැංකු කටයුතු ව්‍යාප්ත වීමත් මෙම ණය ප්‍රදානයන් වැඩි දියුණු වීමට මූලික වශයෙන් හේතු විය.

න.ස.ග්‍රා.ණ.ක්‍ර. යටතේ වී වගාව සඳහා ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය 1989 වසරට වඩා සියයට 74 ක වැඩි වීමක් සටහන් කරමින් 1990 දී රුපියල් දශ ලක්ෂ 361 ක් විය. එකී ණය, වගා කටයුතු සඳහා වර්ෂය තුළ දී ලබා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 62 ක් විය. රළු ධාන්‍ය, මාංශ භෝග, තෙල් බීජ සහ එළවළු වැනි අතිරේක ආහාර භෝග සඳහා ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණයද පසුගිය වසරට වඩා සියයට 191 ක වැඩි වීමක් වාර්තා කළේය.

න.ස.ග්‍රා.ණ. ක්‍රමය යටතේ ප්‍රදානය කරනු ලබන ණය සඳහා බැංකුවලට දැරීමට සිදුවන පාඩුවෙන් සියයට 50 ක් දක්වා ඇප ආවරණ සැලසීම මහ බැංකුව විසින් තවදුරටත් පවත්වා ගෙන යන ලදී. 1990 වර්ෂය අවසානය වන විට ඇප ආවරණ ක්‍රමය යටතේ මහ බැංකුව විසින් ගෙවා ඇති මුළු වන්දි මුදල රුපියල් දශ ලක්ෂ 35.8 කි. ප්‍රතිමූල්‍ය අනුපාතික සහ න.ස.ග්‍රා.ණ.ක්‍ර. යටතේ වගා ණය සැපයීම සඳහා 1986 දී නියම කරන ලද ගොවීන්ට ණය ලබාදෙන පොලී අනුපාතිකයන් 1990 මැද භාගයේ දී ඉහළ නංවන ලදී. ඒ අනුව ප්‍රතිමූල්‍ය අනුපාතිකය වසරකට සියයට 1.5 සිට වසරකට සියයට 4.5 දක්වා වැඩි කරන ලද අතර බැංකුවලට තබා ගත හැකි ආන්තික සීමාව සියයට 7.5 මට්ටමෙහිම නොවෙනස්ව තබමින් ගොවීන්ට ණය සපයන අනුපාතිකය වසරකට සියයට 9 සිට සියයට 12 දක්වා වැඩි කරන ලදී.

වැඩි වූ කෘෂි යෙදවුම්වල මිළ ගණන් වලට ගැලපෙන පරිදි සහ වගා කටයුතු යලි පන ගැන්වීම සඳහා ගොවීන්ට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් ලබාදීමේ අරමුණ ඇතිව එක් එක් භෝග සඳහා තීරණය කරන ලද ණය මුදල් පරිමාවන් අනුව සපයන මුදල් ප්‍රමාණයන් 1990 වසර තුළ ඉහළ නංවන ලදී.

**මැදි සහ දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.)**

1990 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රම 25 යටතේ ණය සැපයූ බැංකු විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා මැදි හා දිගුකාලින ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 192 ක් ප්‍රදනය කරන ලදී. මෙය 1989 වර්ෂයේ අදාළ සංඛ්‍යාවලට වඩා සියයට 160 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වර්ෂය තුළ දී හඳුන්වා දෙන ලද දීප ව්‍යාප්ත ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ වැඩිම ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වන රුපියල් දශ ලක්ෂ 71 ක මුදලක් උපයෝජනය කරන ලදී.

විමසුමට ලක් වූ වර්ෂය තුළ දී සියලුම මැදි හා දිගු කාලීන ණය ක්‍රම යටතේ අදාළ ණයදීමේ අනුපාතිකය වර්ෂයකට සියයට 14 ක් දක්වා සියයට 1.5 කින් ඉහළ නැංවූ අතර බැංකු සඳහා වූ ප්‍රතිමූල්‍ය අනුපාතිකය සියයට 8.5 සිට සියයට 7 දක්වා අඩු කරන ලදී. මේ අනුව ග්‍රාමීය අංශයට වඩාත් ණය පහසුකම් සැපයීම දිරිගැන්වීම වස් සහභාගි වන ණය දෙන ආයතනවල ආන්තික සීමාව සියයට 4 සිට සියයට 7 දක්වා වැඩි කරන ලදී.

## 1 . 63 සංඛ්‍යා සටහන

### තැන්පතු සහ අත්තිකාරම් – ග්‍රාමීය අංශය*

රුපියල් දහස්

| | සමුපකාර ග්‍රාමීය බැංකු | | කෘෂි සේවා මධ්‍යස්ථානවල පිහිටි ලංකා බැංකු උප කාර්යාල | | ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | | සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1989 | 1990 | 1989 | 1990 | 1989 | 1990 | 1989 | 1990 |
| 1. මුළු ඉතුරුම් .. | 2,211,887 | 2,497,322 | 203,861 | 196,496 | 176,097 | 313,871 | 418,000 | 514,253 |
| 1.1 ඉතුරුම් .. | 2,022,768 | 2,279,067 | 162,859 | 160,162 | 144,698 | 268,879 | ලැ.නො. | 422,133 |
| 1.2 විශේෂ ඉතුරුම් .. | — | — | 15,561 | 12,690 | 9,545 | 8,379 | ලැ.නො. | 71,052 |
| 1.3 ස්ථාවර තැන්පතු .. | 189,119 | 218,255 | 25,441 | 23,644 | 21,854 | 36,613 | ලැ.නො. | 21,068 |
| 2. ප්‍රදානය කළ මුළු ණය** .. | *238,726 | 434,718 | 22,512 | 24,589 | 154,661 | 429,780 | 416,000 | 485,341 |
| 2.1 කෘෂිකර්මය .. | 25,785 | 41,124 | 14,140 | 19,509 | 86,854 | 281,381 | ලැ.නො. | 131,254 |
| 2.2 සත්ව පාලනය .. | 7,112 | 26,475 | 87 | 45 | 6,800 | 18,594 | ලැ.නො. | 20,523 |
| 2.3 ධීවර .. | — | — | — | — | 4,006 | 5,348 | ලැ.නො. | — |
| 2.4 කුඩා කර්මාන්ත .. | 10,746 | 30,780 | 38 | 865 | 17,762 | 42,381 | ලැ.නො. | 69,734 |
| 2.5 නිවාස තැනීම, විදුලිකරණය සහ ජල සැපයුම .. | 136,697 | 215,005 | 598 | 312 | — | — | ලැ.නො. | 152,753 |
| 2.6 යෝජනා ක්‍රම/වාණිජ .. | — | 16,406 | — | — | — | 49,290 | ලැ.නො. | 14,699 |
| 2.7 වෙනත් .. | 58,386 | 104,928 | 7,649 | 3,858 | 39,239 | 32,786 | ලැ.නො. | 96,378 |

* ග්‍රාමීය ප්‍රදේශවල පිහිටා ඇති මහජන බැංකු හා ලංකා බැංකු ශාඛාවල තොරතුරු ඇතුළත් නොවේ.
** වර්ෂය තුළ දෙන ලද ණයවල මුළු වටිනාකම.

මූලයන් : මහජන බැංකුව,
ලංකා බැංකුව,
ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු,
සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති.

**සමුපකාර ග්‍රාමීය බැංකුවල ණය පහසුකම් (ස.ග්‍රා.බැ.)**

1990 වර්ෂයේදී ක්‍රියාකාරී සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව 282 ක් වශයෙන් නොවෙනස්ව පැවතුන අතර සමුපකාර ග්‍රාමීය බැංකු විශේෂ ශාඛා සංඛ්‍යාව 39 කින් සීඝ්‍ර ලෙස වැඩි වී මුළු සංඛ්‍යාව 746 ක් විය.

1989 වසරට වඩා සියයට 82 ක වැඩිවීමක් සටහන් කරමින් 1990 වර්ෂය තුළදී සමුපකාර ග්‍රාමීය බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 435 ක් විය. පසුගිය වසරවල මෙන්ම 1990 දී ද සමුපකාර ග්‍රාමීය බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් නිවාස ඉදිකිරීම, විදුලි බලය ලබාදීම සහ ජල සැපයුම සඳහා විය. ඉකුත් වසරට වඩා සියයට 58 ක වැඩිවීමක් වාර්තා කරමින් 1990 වර්ෂය තුළදී කෘෂිකාර්මික අරමුණු සඳහා ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 41 ක් විය.

**කෘෂි රක්ෂණ මණ්ඩලය (කෘ.ර.ම.)**

පසුගිය වසර දෙක තුළ දක්නට ලැබුන පසුබැමේ නැමියාව වෙනස් කරමින් කෘෂි රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණය කරන ලද මුළු බිම් ප්‍රමාණය 1989 දී වූ හෙක්ටයාර 37,000 සිට 1990 දී හෙක්ටයාර 40,000 දක්වා වැඩි විය. මෙම කාලය තුළදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙහි සිදුවූ වැඩිවීමද මෙම නැමියාවට අනුකූල විය. රක්ෂණය කරන ලද බිම් ප්‍රමාණය සියයට 16 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද වාරිකවල මුළු වටිනාකම 1989 දී රුපියල් දශ ලක්ෂ 9.4 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 10.9 දක්වා වැඩි විය. කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් 1989 වර්ෂය තුළදී ගෙවන ලද වන්දි මුදල්වල වටිනාකම වූ රුපියල් දශ ලක්ෂ 10.7 හා සසඳන විට 1990 දී එය රුපියල් දශ ලක්ෂ 8.8 ක් විය. ඒ අනුව 1990 වර්ෂයේදී අයකරන ලද වාරික මුදල් ප්‍රමාණය, වසර තුළදී ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2.1 කින් ඉක්මවිය.

**ග්‍රාමීය ඉතුරුම් රාශීකරණය**

ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි පිහිටි ලංකා බැංකු උප කාර්යාල, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු, සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති සහ සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ඒකරාශී කරන ලද ඉතිරි කිරීම් හා ස්ථාවර තැන්පතු ද ඇතුලුව ග්‍රාමීය ඉතුරුම්වල පැවති මුළු වටිනාකම පසුගිය වසරට වඩා රුපියල් දශ ලක්ෂ 512 ක හෙවත් සියයට 17 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 3,522 ක් විය. ඉතිරි කිරීම් හා ස්ථාවර තැන්පතුවල ආකර්ශනීය පොළී අනුපාතිකත් ග්‍රාමීය ප්‍රදේශ කරා බැංකු ශාඛා ව්‍යාප්ති-යත් නව ඉතුරුම් ක්‍රම හඳුන්වා දීමත් ග්‍රාමීය පදනමකින් යුත් ආර්ථික කටයුතුවල පිබිදීම සහ රටේ බොහෝ ප්‍රදේශවල ආරක්ෂක තත්ත්වය යහපත් අතට හැරීමත් වර්ෂය තුළදී ඉතුරුම් රාශීකරණය වර්ධනය වීමට හේතු සාධක වූ කරුණුය. මුළු ඉතුරුම් වටිනාකමින් රුපියල් දශ ලක්ෂ 2,497 ක් හෙවත් සියයට 71 ක් සමුපකාර ග්‍රාමීය බැංකු සතු විය. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සතු ඉතුරුම් ප්‍රමාණය පසුගිය වසරට වඩා සියයට 78 ක වැඩිවීමක් වාර්තා කරමින් 1990 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 314 ක් විය.

**මහ බැංකු කටයුතු**

වසර තුළදී රුපියල් දශ ලක්ෂ 14,692 ක හෙවත් සියයට 23 ක වර්ධනයක් වාර්තා කරමින් 1990 වර්ෂය අවසානයේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 77,462 ක් විය. මේ හා සැසඳුන 1989 වර්ෂයේ වර්ධනය රුපියල් දශ ලක්ෂ 7,439 ක් හෙවත් සියයට 13 ක් විය.

වත්කම් අංශයෙහිලා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය (දළ) 1990 දී රුපියල් දශ ලක්ෂ 6,436 කින් හෙවත් සියයට 65 කින් සැළකිය යුතු අන්දමින් වර්ධනය විය. මෙය එතෙර පැවති මුදල් සහ ශේෂ සහ භාණ්ඩාගාර බිල්පත්, විදේශීය රාජ්‍ය සහ රාජ්‍ය නොවන සුරැකුම්පත් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 4,016 කින් සහ රුපියල් දශ ලක්ෂ 2,856 කින් වැඩිවීමෙත්, විශේෂ ගැණුම් හිමිකම රුපියල් දශ ලක්ෂ 436 කින් අඩුවීමෙත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

මහ බැංකුවේ දේශීය වත්කම් (අනෙකුත් වත්කම් හා ගිණුම් හැර) 1989 දී වූ සියයට 2 ක හෙවත් රුපියල් දශ ලක්ෂ 761 ක සුළු වර්ධනය හා සසඳන කල, 1990 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 4,483 ක හෙවත් සියයට 11 ක වර්ධනයක් වාර්තා කර ඇත. රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 3,562 කින් හෙවත් සියයට 47 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ඇති වගකීම් ප්‍රති ඇගයීම් සඳහා කරනු ලැබූ ගැලපීම් (සලාකයද ඇතුළුව) සඳහා රජයට දෙනු ලැබූ රුපියල් දශ ලක්ෂ 3,055 ක විශේෂ ණය හේතුවෙන් වූ අතර, රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 2,097 කින් හෙවත් සියයට 7.2 කින් පහත වැටුණි. මේ අතර, 1990 දී වාණිජ බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට දෙන ලද අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 1,018 කින් හෙවත් සියයට 70 කින් වැඩි වූ අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, වර්ෂය තුළදී කෙටි කාලීන ප්‍රතිමූල්‍ය ණය රුපියල් දශ ලක්ෂ 2,045 කින් වර්ධනය වීමයි. මහ බැංකුවේ අනෙකුත් වත්කම් හා ගිණුම්, 1989 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 4,332 (සියයට 58) ක වර්ධනය හා සසඳන විට, 1990 වර්ෂයේදී, රුපියල් දශ ලක්ෂ 3,773 (සියයට 32) කින් වර්ධනය විය.

වගකීම් අංශයෙහිලා සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සහ තැන්පතු වලින් සමන්විත මූල්‍ය වගකීම් 1990 දී රුපියල් දශ ලක්ෂ 11,661 කින් වැඩි විය. තැන්පතු වගකීම් සහ සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8,887 කින් සහ රුපියල් දශ ලක්ෂ 2,774 කින් ඉහළ ගියේය. විදේශීය රාජ්‍ය, විදේශීය බැංකු ආයතන, වාණිජ බැංකු, රාජ්‍ය නියෝජ්‍යායතන සහ රාජ්‍ය ආයතනවල තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 6,070 කින් රුපියල් දශ ලක්ෂ 1,861 කින් රුපියල් දශ ලක්ෂ 829 සහ රුපියල් දශ ලක්ෂ 152 කින් වර්ධනය වූ අතර, අනෙකුත් ආයතනවල තැන්පතු රුපියල් දශ ලක්ෂ 25 කින් පහත වැටුණි. විමසුමට භාජනය වන වසර තුළදී විදේශ වලින් ලබාගත් කෙටිකාලීන ණය හේතුවෙන් මහ බැංකුව මගින් නොපියවා පැවති වගකීම් රුපියල් දශ ලක්ෂ 2,631 කින් සැළකිය යුතු අන්දමින් පහත වැටුනි. මේ හා සැසඳුන 1989 වර්ෂයේ වර්ධනය රුපියල් දශ ලක්ෂ 2,401 කි. මේ අතර, මහ බැංකුවේ අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 5,161 කින් ඉහළ නැගුණි. පසුගිය වර්ෂයේදී එකී වගකීම්වල වර්ධනය රුපියල් දශ ලක්ෂ 2,516 කි.

## පොලී අනුපාතික


ඉහළ මට්ටමක පැවති උද්ධමනය සහ විශේෂයෙන්ව වසරේ දෙවැනි භාගයේදී වේගවත් වූ දේශීය ණය වර්ධනය හමුවේ, පසුගිය වර්ෂයේදී මෙන්ම 1990 දී පොලී අනුපාතික තවදුරටත් ඉහළ තත්ත්වයක පැවතුණි. මහ බැංකු පොලී අනුපාතිකය 1990 ජූලි මාසයේ දී සියයට 14 සිට සියයට 15 දක්වා ඉහළ නංවන ලද අතර, අනෙකුත් වෙළෙඳපොලවල පොලී අනුපාතික වෙළෙඳපොල තත්ත්වයේ බලපෑමට යටත්විය.

## කෙටි කාලීන පොලී අනුපාතික

රජය මගින් අරමුදල් සඳහා පවත්නා ඉහළ ගිය ඉල්ලුම පිළිබිඹු කරමින් විශේෂයෙන් 1990 දෙවැනි භාගයේදී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ පොලී අනුපාතිකයන්හි වර්ධනය වීමේ හැකියාවක් පෙන්නුම් කෙරිණි. ඒ අනුව, භාණ්ඩාගාර බිල්පත් හි වාර්ෂිකව

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

බර තබන ලද එලදාව, 1989 දෙසැම්බර් මාසයේ පැවති වාර්ෂිකව සියයට 18.10–19.10 පරාසයක සිට 1990 මැයි මාසය වන විට වාර්ෂිකව සියයට 15.4–16.9 දක්වා පරාසයකට අඩුවී, 1990 දෙවැනි භාගයේදී වැඩිවීමේ නැඹියාවක් පිළිබිඹු කරමින් 17.4–18.4 පරාසයකට ඉහළ නැගුණි. මේ අතර 1990 දී ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළඳ පොලෙහි වට්ටම් අනුපාතිකය සහ ප්‍රති වට්ටම් අනුපාතිකය, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත්වල පොලී අනුපාතිකයට අනුකූලව ප්‍රති-ශෝධනය කරන ලද අතර, වසර අවසාන භාගයේදී පොලී අනුපාතික පසුගිය වසර අගදී පැවති ප්‍රමාණයටම බොහෝ දුරට ආසන්නව පැවතුනි. උදාහරණයක් ලෙස, 1989 වර්ෂය අවසානයේදී වට්ටම් අනුපාතික සහ ප්‍රතිවට්ටම් අනුපාතික සියයට 15.50 සහ සියයට 20.50 සිට 1990 මැයි මාසයේදී පිළිවෙලින් සියයට 12.75 සහ සියයට 17.75 දක්වා පහත වැටුණ නමුදු 1990 අවසාන වන විට පසුගිය වසර අවසානයේදී පැවති පොලී අනුපාතික මට්ටම්වලට ඉහළ නැගුණි. පසුගිය වර්ෂයේ දී ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොලෙහි වට්ටම් සහ ප්‍රතිවට්ටම් අනුපාතික වාර්ෂිකව පිළිවෙලින් සියයට 12.50–15.75 සහ සියයට 17.50–20.75 පරාසයක පැවති අතර, 1990 දී එහි අනුපාතික වාර්ෂිකව පිළිවෙලින් සියයට 12.75–15.75 සහ සියයට 17.75–20.75 ප්‍රමාණයේ පැවතුණි.

ඉහත තත්ත්වයනට වෙනස්ව, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි පොලී අනුපාතික, වර්ෂය තුළදී සැළකිය යුතු අන්දමින් උච්චාවචනය වීමක් පෙන්නුම් කළේය. උදාහරණයක් ලෙස, 1990 ප්‍රථම කාර්තුවේදී මෙම වෙළඳපොලෙහි පොලී අනුපාතික, පසුගිය වර්ෂයේ අවසාන කාර්තුවේ අත්දැකීමට ලැබුණු, වාර්ෂිකව සියයට 13-25 පරාසයක සිට වාර්ෂිකව සියයට 13–15 දක්වා පරාසයකට පහත වැටුණු අතර, 1990 අගෝස්තු මාසයේදී වාර්ෂිකව සියයට 19–30 දක්වා ඉහළ පරාසයකට වැඩිවිණි. මෙම අනුපාතික යළිත් 1990 සිවුවන කාර්තුව අවසානයේදී වාර්ෂිකව සියයට 14–19 දක්වා පරාසයකට පහත වැටුණි.

වාණිජ බැංකුවල එක් අවුරුදු ස්ථාවර තැන්පතුවල අවම සහ උපරිම පොලී අනුපාතික 1989 අවසානයේදී, වාර්ෂිකව සියයට 11.0–20.5 ප්‍රමාණයේ සිට 1990 මාර්තු මාසයේදී වාර්ෂිකව සියයට 7.0–18.5 ප්‍රමාණයට පහත වැටුණ ද අනතුරුව වැඩිවී 1990 වර්ෂය අවසානයේදී වාර්ෂිකව සියයට 11.0–21.0 දක්වා ප්‍රමාණයකට වර්ධනය විය. මෙම පුළුල් පරාසය තුළ ඇතැම් වාණිජ බැංකු තම එක් අවුරුදු ස්ථාවර තැන්පතු සඳහා වූ පොලී අනුපාතික වාර්ෂිකව සියයට 11–15 සිට 14–17 ප්‍රමාණයකට විමසුමට ලක්කෙරුණ වර්ෂය තුළදී ඉහළ නංවන ලදී. ජාතික ඉතිරි කිරීමේ බැංකුවද, ස්වකීය ඉතිරි කිරීමේ සහ ස්ථාවර තැන්පතුවල පොලී අනුපාතික ප්‍රතිශත අංක 2 කින් ඉහළ නංවමින්, වාණිජ බැංකු අතර තම තරඟකාරීත්වය ආරක්ෂා කරගන්නා ලදී.

විමසුමට ලක් කෙරුණ වර්ෂය තුළ, වාණිජ බැංකු මගින් තැන්පතු සහතික සඳහා දෙන ලද පොලී අනුපාතිකයන් වාර්ෂිකව සියයට 7–21.7 ප්‍රමාණයේ පැවතුණි. තැන්පතු සහතික සඳහා මූල්‍ය සමාගම් මගින් දෙන ලද පොලී අනුපාතික වාර්ෂිකව සියයට 12–22 ප්‍රමාණයේ බොහෝදුරට නොවෙනස් මට්ටමක පැවතුණි. මේ අතර මූල්‍ය සමාගම්වල තැන්පතු අනුපාතික මත පනවන ලද සීමාවන්, මාස 24 ට අඩු සහ මාස 24 ට වැඩි තැන්පතු සඳහා වූ පොලී අනුපාතිකයන් වාර්ෂිකව සියයට 21 සහ වාර්ෂිකව සියයට 24 ප්‍රමාණයේ නොවෙනස්ව පැවතුනි.

මහ බැංකුව 1990 දී කෘෂිකාර්මික ප්‍රතිමූල්‍ය ණය ක්‍රමය යටතේ වූ පොලී අනුපාතික වැඩි කරන ලදී. ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 1.5 සිට වාර්ෂිකව සියයට 4.5 දක්වා ඉහළ දමන ලද අතර, ණය ආයතනවලට අනුමත කරන ලද ආන්තික සීමාව සියයට 7.5 ප්‍රමාණයේ නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. ඒ අතර ණය ගනුවන්ට අදාළ වන උපරිම පොලී අනුපාතිකය සියයට 9 සිට වාර්ෂිකව සියයට 12 දක්වා වැඩි කරන ලදී.

තැන්පතු අනුපාතික මගින් වාර්තා තබන ලද රටාව අනුව යමින්, මහ බැංකුව විසින් සත් පදනමක් මත සකස් කරනු ලබන වාණිජ බැංකු බර තැබූ ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය, 1990 ප්‍රථම භාගයේදී අඩුවීමේ නැමියාවක් පෙන්නුම් කරන ලදී. එහෙත් 1990 දෙවැනි භාගයේදී එය වැඩිවීමක් පෙන්නුම් කළේය. බර තබන ලද ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය 1990 ජුනි මාසයේදී සියයට 17.0 ක ප්‍රමාණයකින් වසර තුළදී අඩුම අනුපාතිකයක් වාර්තා කළ අතර වැඩිම අනුපාතිකය වූ සියයට 18.6 ක ප්‍රමාණයක් වාර්තා කළේ දෙසැම්බර් මාසයේය.

## දිගු කාලීන පොලී අනුපාතික

1990 වර්ෂය තුළදී රජයේ සුරැකුම්පත් කාණ්ඩ 8 ක් නිකුත් කරන ලදී. මෙම සුරැකුම්පත් සඳහා පරිණත කාලය අවුරුදු 4 ක් වූ අතර, පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 13 ක් විය. මෙය, 1989 වර්ෂයේදී නිකුත් කරන ලද අවුරුදු 5–6 පරිණත කාලයක් සඳහා වූ සියයට 11–12 ප්‍රමාණික පොලී අනුපාතිකයන් සමග සැසඳේ. 1990 මැයි මාසයේදී මහ බැංකුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහජනයා වෙත භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත් කිරීම ප්‍රකාශයට පත් කරන ලදී. භාණ්ඩාගාර තැන්පතු සහතික සඳහා එලදා අනුපාතිකය 1990 මැයි මාසයේදී, වාර්ෂිකව සියයට 14.6–16.5 සිට ඔක්තෝබර් මාසයේදී වාර්ෂිකව සියයට 17.1–19.0 දක්වා ඉහළ නැගුණ අතර, 1990 අවසාන මාස දෙක තුළදී නොවෙනස් මට්ටමක පැවතුණි. මේ අතර, ජාතික ආරක්ෂක වියදම් පියවා ගනු වස් අරමුදල් රැස්කිරීම අරභයා මහ බැංකුව 1990 ජූලි මාසයේදී සහ ඔක්තෝබර් මාසයේදී පරිණත කාලය අවුරුදු 3 ක් සඳහා වූ වාර්ෂිකව සියයට 15 ක පොලී අනුපාතිකයන්ගෙන් යුතු ජාතික ආරක්ෂක බැඳුම්කර කාණ්ඩ 2 ක් නිකුත් කරන ලදී.

මහ බැංකුව 1990 අප්‍රේල් මාසයේදී, මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ දෙනු ලබන ණය සඳහා වූ පොලී අනුපාතික ප්‍රතිශෝධනය කළේය. ණය දෙන ආයතන සඳහා අංක 1 කාණ්ඩය යටතේ (කෘෂිකාර්මික හා ධීවර කටයුතු දිරිගැන්වීම සහ සංවර්ධනය කිරීම අදාළ අමාත්‍යාංශ මගින් අනුමත කරන ලද බදු සහන සහිත) සහ අංක 11 කාණ්ඩය යටතේ (අපනයන දිරිගැන්වීම සහ සංවර්ධනය) අනුමත කරන ලද ආන්තිකයන් ඉහළ නංවන ලද අතර, මෙම කාණ්ඩ සඳහා අදාළ මහ බැංකු ප්‍රතිමූල්‍යා අනුපාතිකයන් අඩු කරන ලදී. අංක 1 කාණ්ඩය යටතේ ණය දෙන ආයතන වලට පනවන ලද ආන්තිකයන් ප්‍රතිශත අංක 4 සිට ප්‍රතිශත අංක 7 දක්වා වැඩි කරන ලද අතර, මහ බැංකු ප්‍රතිමූල්‍යා අනුපාතික සියයට 7.5 සිට වාර්ෂිකව සියයට 7.0 දක්වා අඩුකරන ලදී. අංක 11 කාණ්ඩය යටතේ ණය දෙන ආයතන සඳහා අනුමත කරන ලද ආන්තිකයන් ප්‍රතිශත අංක 2 සිට ප්‍රතිශත අංක 4 දක්වා වැඩිකළ අතර, මහ බැංකු ප්‍රතිමූල්‍යා අනුපාතික ප්‍රතිශත අංක දෙකකින් අඩුකරන ලදී. ඒ අනුව අංක 1 කාණ්ඩය යටතේ අයදුම් කළහැකි ණය සඳහා ඉහළම පොලී අනුපාතිකය වාර්ෂිකව සියයට 11.5 සිට වාර්ෂිකව සියයට 14.0 දක්වා වැඩිවූ අතර, අංක 11 කාණ්ඩය යටතේ දෙන ලද ණය සඳහා පොලී අනුපාතික පැවති මට්ටමෙම එනම්, රුපියල් දශ ලක්ෂ 5 කට අඩු ණය සඳහා සියයට 9 ක පොලී අනුපාතිකයක්ද, රුපියල් දශ ලක්ෂ 5 කට වැඩි ණය සඳහා සියයට 10 ක පොලී අනුපාතිකයක් ද වශයෙන් පැවතිණි.

පසුගිය වර්ෂයේ මෙන්ම, ජාතික සංවර්ධන බැංකුවේ ණය දීමේ අනුපාතික වෙළඳපොල පොලී අනුපාතික හා පදනම්ව සිදුවිය. ඒ අනුව එහි තුන්වැනි සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත (සුමක) ව්‍යාපෘතිය යටතේ 6 මාසයක කාලයක් සඳහා ප්‍රතිමූල්‍යා අනුපාතිකයන් ගණනය කරනු ලැබුයේ ඊට පෙර මාස 6 තුළ පැවති වාණිජ බැංකු සාමාන්‍ය බර තැබූ ප්‍රමුඛ ණයදීමේ අනුපාතිකයන්ගේ ප්‍රතිශත අංක 6 ක් අඩුකිරීමෙනි. කෙසේ වෙතත්, ණයදෙන ආයතනවලට සිය මෙහෙයවුම් පිරිවැය හා ව්‍යාපෘති අවදානම පදනම් කරගෙන ප්‍රතිමූල්‍යා පොලී හා ණයදීමේ අනුපාතික අතර පරතරය තීරණය කිරීම සඳහා අවශ්‍ය නිදහස සලසා දෙන ලදී. මේ අතර ලංකා සංවර්ධන මූල්‍යා සමායතනය මගින් සුමක ගණුදෙනුකරුවන්ට දෙනු ලබන ණය සඳහා වූ අනුපාතිකය 1989 වර්ෂයෙහිදී වූ සියයට 16.5 ප්‍රමාණය හා සසඳන විට 1990 අවසානයේදී

17.5 ක් විය. 1988 දී මෙය 14.5 ක් විය. ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය විසින්, උපකරණ මූල්‍යකරණය, වාණිජ ගොඩනැගිලි ඉදි කිරීම, කාරක ප්‍රාග්ධනය සහ පියවුම් ණය සඳහා දෙනු ලබන මූල්‍ය සඳහා අයකළ පොලී අනුපාතිකය 1990 දී වාර්ෂිකව සියයට 17.5 සහ 22.0 අතර ප්‍රමාණයක පැවති අතර, ඒ හා සැසඳුන පසුගිය වර්ෂයේ අනුපාතිකය සියයට 15.0 සහ සියයට 18.0 අතර ප්‍රමාණයක පැවතුණි. ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වසරකට සියයට 18 සහ සියයට 22 අතර පොලී අනුපාතිකයන් යටතේ නිවාස ණය සැපයීය. මේ හා සැසඳුන 1989 වර්ෂයේ අනුපාතිකයන් වාර්ෂිකව සියයට 13 සහ සියයට 20 අතර විය.

## මූල්‍ය ප්‍රතිපත්තිය

දේශීය මෙන්ම විදේශීය සාධකයන් හේතුකොටගෙන නොකඩවා පැවති වර්ධනය වූ ද්‍රවශීලතා තත්ත්වය හමුවේ, 1989 වසරේ අනුගමනය කරන ලද සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තීන් 1990 වසර තුළද තවදුරටත් පවත්වාගෙන යාමට අධිකාරීන්ට සිදුවිය. වර්ෂය පුරා පැවති අධික උද්ධමනාත්මක පීඩනයන් හේතුවෙන් සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කිරීමේ අවශ්‍යතාවයන් පැවතුණි. ඒ අනුව, 1989 වසර අවසානය වන විට පැවති සීමාවන්ට අමතර වශයෙන් 1990 වසර තුල පහත දැක්වෙන මූල්‍ය ප්‍රතිපත්ති පියවරයන් හඳුන්වා දෙනු ලැබීය. පළමුව, 1990 ජූලි මාසයේදී බැංකු අනුපාතිකය සියයට 15 ක් දක්වා ප්‍රතිශත අංක 1 කින් ඉහළ නැංවුණි. දෙවනුව, මහ බැංකු ප්‍රතිමූල්‍ය පහසුකම් ගණනාවක් සඳහා වූ පොලී අනුපාතිකයන් ද ඉහළ නංවන ලදී.

මෑත කාලීන උපනතිය අනුගමනය කරමින්, 1990 වසර තුළදී ද මූල්‍ය ප්‍රතිපත්තියේ මූලික අවධානය විවෘත වෙළඳපල කටයුතු වෙත යොමු විය. ඒ අනුව මහ බැංකුව සිය දේශීය වත්කම්වල වර්ධන අනුපාතය මධ්‍යස්ථ කිරීමේ අරමුණින් සහ එමගින් ආර්ථිකයේ සමස්ත ද්‍රවශීලතාවයේ වර්ධනයද සමනය කිරීමේ අදහසින්, ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් විකිණීම තුලින් විවෘත වෙළඳපොල කටයුතු වඩාත් පුළුල් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අතර 1989 වසරේ පනවන ලද ආංශික ණය සීමාවන් සහ අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වූ ණයවර ලිපි සම්බන්ධයෙන් පැනවූ සියයට සියයේ ආන්තික අවශ්‍යතාවන් ආදීවූ වෙළඳපොල නොවන ණය පාලන පියවරයන් 1990 වසර තුලදී ද කෙටි කාලීන නිරවද්‍යතා උපක්‍රම වශයෙන් තවදුරටත් පවත්වාගෙන යන ලද්දේ එම ප්‍රතිපත්ති අත්හිටුවීමට තරම් සතුටුදායක මට්ටමක් දක්වා උද්ධමනකාරී තත්ත්වය යහපත් අතට වර්ධනය නොවූ බැවිනි. කෙසේ වුවද, ආර්ථික වර්ධන ක්‍රියාවලිය පවත්වාගැනීමේ අරමුණින්, ආර්ථිකයේ ප්‍රමුඛතා සහ ඵලදායී අංශ සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් තවදුරටත් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුව මත වූ වගකීමක් විය. විවිධ ප්‍රතිමූල්‍ය ක්‍රම යටතේ මහ බැංකුව විසින් සපයන ලද ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ නොපියවන ලද ශේෂය 1990 වර්ෂය තුළ රුපියල් දශ ලක්ෂ 2,759 කින් වැඩිවී වර්ෂය අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 7,070 ක් ව පැවතිණි.

විමසුමට ලක්වන වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත්වල ඵලදාවන් වෙළඳපොල තත්ත්වයන් මත තීරණය වීමට ඉඩ හැරිණි. ඒ අනුව, ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත්වල ඵලදායිතාව 1989 වර්ෂය අවසානයේ සියයට 18.1 සිට 1990 ජූනි අවසානය වන විට සියයට 15.5 දක්වා පහත වැටුණි. මෙයට සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් මාස 6 ක් සහ මාස 12 ක් වන භාණ්ඩාගාර බිල්පත්වල ඵලදාව ඉහත කාලසීමාව ඇතුළත පිළිවෙලින් සියයට 18.2 සිට සියයට 15.7 දක්වාත්, සියයට 19.1 සිට සියයට 16.9 දක්වාත් පහත වැටුණි. කෙසේ වුවද, වර්ෂයේ දෙවැනි භාගය තුල බිල්පත්වල ඵලදාවන් නැවත ඉහළ ගියේය. උදාහරණයක් ලෙස, ත්‍රෛමාසික බිල්පත් සඳහා වූ ඵලදාව සියයට 17.4 දක්වාත්, මාස 6 ක් සහ මාස 12 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ඵලදාව පිළිවෙලින් සියයට 18.0 සහ 18.4 දක්වාත් වර්ෂය අවසානය වන විට ඉහළ නැගුණි.

විශේෂයෙන් මූල්‍ය ආයතනයන්හි කෙටිකාලීන අතිරික්ත අරමුදල් සඳහා ආයෝජන අවස්ථාවන් සපයාදීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා මහ බැංකුව ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොල කටයුතුවල පෙර පරිදිම තවදුරටත් නියැළුණි. වර්ෂය තුළදී, මෙම වෙළඳපොළේ සමස්ත විකුණුම්වල වටිනාකම රුපියල් බිලියන 67.2 ක් වූ අතර මිළදී ගැනීම්වල වටිනාකම රුපියල් බිලියන 21.1 ක් විය. මේ අනුව සමස්ත ගණුදෙනුවල අගය රුපියල් බිලියන 88.3 කි.

ප්‍රාථමික මෙන්ම ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොල වල ක්‍රියාකාරීත්වය ඉහළයාමට ප්‍රතිචාර වශයෙන්, බැංකු නොවන අංශය සතු භාණ්ඩාගාර බිල්පත් 1989 වසර අවසානයේදී රුපියල් බිලියන 15.5 සිට 1990 අවසානය වන විට රුපියල් බිලියන 22.9 ක් දක්වා ඉහළ නැගුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත්වල බැංකු නොවන අංශයේ දායකත්වය, මෙම වසර දෙක ඇතුළත සියයට 31 සිට සියයට 37 දක්වා වැඩි විය. මේ අතර විවෘත වෙළඳපොල කටයුතුවල කාර්යක්ෂමතාවය පිළිබිඹු කරමින් 1990 දී මුළු භාණ්ඩාගාර බිල්පත් නිකුතුව රුපියල් බිලියන 10.4 කින් (නාමික අගය) වර්ධනය වී තිබියදීත් මුළු භාණ්ඩාගාර බිල්පත් වලින් මහ බැංකුව සතු කොටස සියයට 57 සිට සියයට 44 දක්වා මෙම කාලසීමාවන් දෙක අතර පහළ වැටුණි.

මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.) වෙතැති සම්පත් ප්‍රමාණය 1990 ජුනි මස රුපියල් දශ ලක්ෂ 625 කින්ද, නැවත 1990 ඔක්තෝබර් මස තවත් රුපියල් දශ ලක්ෂ 750 කින්ද, ඉහළ නංවන ලද අතර, 1990 වර්ෂය අවසානයේදී අරමුදල සතු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,250 ක් විය. මෙම අරමුදල් ප්‍රසාරණය පිළිබිඹු කරමින් මැ.දි.ණ.අ. යටතේ උපයෝජනය කළ අරමුදල් ප්‍රමාණය 1989 වසර අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 1,572 සිට 1990 අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 2,545 ක් දක්වා වර්ධනය විය. මෙයට අමතරව, මූල්‍ය සමාගම් වලට ලබාදුන් ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය වර්ෂය තුල රුපියල් දශ ලක්ෂ 238 ක වර්ධනයක් පෙන්නුම් කරමින් වර්ෂය අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 684 ක් විය. මේ අතර, අපනයන ප්‍රති මූල්‍ය යෝජනා ක්‍රම (1 වන සහ 11 වන කාණ්ඩ යටතේ) සහ කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය යටතේ වූ නොපියවන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 115 කින් සහ රුපියල් දශ ලක්ෂ 175 කින් වැඩි විය. 1990 වසරේ සමස්ත ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයේ ප්‍රසාරණයට ප්‍රධාන හේතුව වූයේ වර්ෂය තුළදී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයට සහ අපේක්ෂිත තොග පවත්වාගැනීම සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට දෙන ලද රුපියල් දශ ලක්ෂ 1,500 ක විශේෂ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය පහසුකම් ය.